වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2022



කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE
UNIVERSITY OF PERADENIYA

වාර්ෂික වාර්තාව

2022



කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දැක්ම

කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධි සහ පර්යේෂණයන්හි විශිෂ්ට වූ ගෝලීය තරඟකාරී මධ්‍යස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

උසස් ගුණාත්මක බවින් යුත් පශ්චාත් උපාධි අධ්‍යාපනය සපයමින් උසස් ඵලදායි සහ නව්‍යතාවයෙන් යුත් ප්‍රමුඛ පර්යේෂණයන් දිරිගන්වමින් කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි ප්‍රවීනතාවයෙන් හෙබි වෘත්තිකයන් බිහි කිරීම

ඉලක්ක

- ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව සියලුම පශ්චාත් උපාධිවල ගුණාත්මක භාවය සහ අදාළත්වය සහතික කිරීම.
- පශ්චාත් උපාධි පාඨමාලා වඩාත් නම්‍යශීලි ප්‍රවේශ්‍ය, නව්‍යකරණ සහ විවෘත කිරීම මඟින් පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා අවස්ථාව වැඩි දියුණු කිරීම.
- උසස් තත්ත්වයේ පර්යේෂණ. නවෝත්පාදන සහ ධාරිතා ගොඩනැඟීම ප්‍රවර්ධනය කිරීම මඟින් විචිත්‍රවත් පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම.
- තිරසාර යහපත් පාලන රාමුවක් තුළ පරිපාලන හා මූල්‍ය කළමණාකරණය ශක්තිමත් කිරීම.
- ප්‍රවීණ සහ කැපවීමෙන් ක්‍රියාකරන අධ්‍යයන පරිපාලන, තාක්ෂණික සහ සහායක කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව ආචාරාත්මක සහ සදාචාරාත්මක වටිනාකාකම් සහ නායකත්ව ගුණාංග සහිත වීම.
- ධාරිතාව සහ විනිදුම් කටයුතුවල පරාසය වැඩි දියුණු කිරීම.

අධ්‍යක්ෂකතුමාගේ ප්‍රකාශය / සමාලෝචනය



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරන ප්‍රඥප්තිය යටතේ මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව කමනාකරණ මණ්ඩලයක මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වනු ලබයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ රට තුළ පවත්නා ධාරිතාවය වැඩි දියුණු කිරීමත් ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් පුළුල් වන කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අවැසි මනා පුහුණුවක් ලද විද්‍යාත්මක දැනුමෙන් සපිරි පිරිසක් බිහි කිරීමත් ය. දශක හතරකට ආසන්න කාලයක් පුරාවට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම ජාතික මෙහෙවරෙහි නියැළෙන්නේ අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳ මෙරට සහ කලාපීය විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වෙමිනි.

වර්තමානයේදී ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මාර්ගපදේශ අනුව, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් විද්‍යාපති උපාධි පාඨමාලා 30 ක් ද (ව්‍යාපාර පරිපාලනපතිද ඇතුළුව) (SLQF L9) සහ පාඨමාලා වැඩ හා පර්යේෂණ වශයෙන් (SLQF L10) පාඨමාලා 30 ක් ද පර්යේෂණ උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී වශයෙන්) පාඨමාලාවන් ද අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පිරිනමනු ලබයි. තමන්ටම අනන්‍ය වූ සුවිශේෂී ඉගැන්වීම් සහිත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බොහොමයක්ම පාඨමාලා මෙහෙයවනු ලබන්නේ පුළුල් ඉගැන්වීම් සහ පර්යේෂණ අත්දැකීම්වලින් පරිණත විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාතික සහ අන්තර්ජාතික ආයතන සහ පෞද්ගලික ආයතනයන්හි අනුයුක්ත බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් මඟිනි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය හරහා අති නවීන තාක්ෂණික උපකරණ සහිත අංග සම්පූර්ණ විද්‍යාගාර පහසුකම් යටතේ ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය ලබාදෙයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මේ වන විට අවධානය යොමු කර ඇත්තේ අධ්‍යයන දැනුම ලබාදීමට පමණක් සීමා නොවී බොහෝ නව්‍ය සහ ඵලදායක පර්යේෂණ වල යෙදෙන සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට ය.

පසුගිය දශක හතරක කාල පරිච්ඡේදය තුළ විවිධ වූ උපාධි අධ්‍යයන පාඨමාලා හරහා ශිෂ්‍ය බඳවා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් ආයතනය හිමිකරගෙන ඇති අතර එය ආරම්භගේ දී සිසුන් 19 ක් වූ නමුත් මේ වන විට වාර්ෂිකව සිසුන් 500 ඉක්මවා ඉහළ ගොස් ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රගේ ඉතා පුළුල් විෂය පරාසයක් තුළ 6000කට අධික වූ පශ්චාත් උපාධිධාරීන් මේ දක්වා මෙම ආයතනය විසින් බිහි කර ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව විවිධ විෂය ධාරා හැදෑරූ උපාධිධාරීන්ගෙන් සමන්විත වෙයි.විවිධ රටවලින් පැමිණි විදේශීය උපාධිධාරීන් මේ වන විට ඔවුන්ගේ පශ්චාත් උපාධි, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී සම්පූර්ණ කර ඇති අතර තායිලන්තය සහ මාලදිවයින යන රටවලින් පැමිණිය ශිෂ්‍යයෝ වර්තමානයේ දී ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරමින් සිටිති. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම නිම්වළලු සමාජයේ පුළුල් පරාසයකට ව්‍යාප්ත කරමින් කොළඹ අග නගරයේ දී විද්‍යාපති උපාධි 04ක් ප්‍රදානය කරන පාඨමාලාවන් අති සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේය. ඇතැම් පශ්චාත් උපාධි ඕස්ට්‍රේලියාවේ ක්විස්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව පිරිනමනු ලබයි.

කොවිඩ් 19 වසංගතයත් සමගම, පසුකාලීනව පැමිණි ඉන්ධන සහ ආර්ථික අර්බුදද සමඟින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම ඉගැනුම් ක්‍රමවේදය මාර්ගගත ක්‍රමයට ලබාදීමටත් ඇගයීමටත් වෙනස්වූවේය. පර්යේෂණ ආවරණ විභාගයන් ද මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරන ලද්දේ ප්‍රමාදයන් වලක්වා ගනිමිනි. වර්තමානයේ දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියලුම අධ්‍යයන පාඨමාලා මාර්ගගත ක්‍රමයට උගන්වනුයේ අවශ්‍ය ප්‍රායෝගික පන්ති, කෙෂත්‍ර චාරිකා සහ විභාග සාමාන්‍ය ක්‍රමයට පවත්වමින් වන අතර අනාගතයේ දී නූතන තාක්ෂණික යටිතල සංවර්ධන උපාය මාර්ග හඳුන්වාදෙමින් ඉගැන්වීම් කරගෙන යාමට ආයතනය සැලසුම් කර ඇත.

මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව
අධ්‍යක්ෂක

පටුන

පිටුව

අ	හැඳින්වීම	01
ආ	ජයග්‍රහණය	05
ඇ	බාධක	05
ඈ	අනාගත සැලසුම්	05
ඉ	ජාත්‍යන්තරීකරණය	16
ඊ	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2022 වර්ෂයේදී ඉලක්ක ගත තිරසාර භාවයට අදාළ වැඩසටහන්	17
කෘෂිකර්ම විද්‍යා පුස්තකාල වාර්තාව		18
මූල්‍ය ක්‍රියාකාරකම්		21
ව්‍යවස්ථාපිත වාර්තාව සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම		25
1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) ඡේදය ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධික කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සහ පිළිතුර		55

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය - 2022

නිලබලයෙන් පත්වන ලද සාමාජිකයින්

01 මහාචාර්ය සී.එම්. බී .දෙමටවැව මයා, අධ්‍යක්ෂ,කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

02 ඩබ්. කේ. එල් .ඊ .වල්ලාවිට මයා, ප්‍රධාන මුල්‍ය නිලධාරි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා

03 කේ. ජී.පී. පුෂ්පකුමාර මයා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

04 ආචාර්ය ඩබ්.එල්.ජී. සමරසිංහ මයා, අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) කෘෂිකර්ම අමාත්‍යාංශය

05 ආචාර්ය කේ. එම්. ඒ.බණ්ඩාර - වන සංරක්ෂණ ජෙනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්

06 මහාචාර්ය.ජී සේනානායක, සභාපති, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

07 ඒ.එම් ජේ.ඉලංකෝන් මැණිකේ. අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

08 ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල, අධ්‍යක්ෂ
ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

09 ඒ.පී.පී. දිස්නා මිය,අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

10 මහචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු මයා,පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

11 මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර, පීඨාධිපති, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

12 ආචාර්ය ජී.වී.ටී.වී. වීරසූරිය, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය

13 මහාචාර්ය ජේ. සි .එදිරිසිංහ, පීඨාධිපති,කෘෂිකර්ම පීඨය, වයඹ විශ්වවිද්‍යාලය

14 මහාචාර්ය පී.එම්.ඒ.එස්.කරුණාරත්න,පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය

15 මහාචාර්ය එස්.ඩී.වන්නි ආරච්චි පීඨාපධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය,රුහුණු විශ්වවිද්‍යාලය

16 ආචාර්ය එම්.පග්නිනාදන්,පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය

17 ආචාර්ය එස් වසන්තරූබා,පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය

කෘෂිකර්ම පීඨයෙන් තෝරාපත්කරණ ලද සාමාජිකයින්

18 මහාචාර්ය එස්.ඒ.සී.එන්.පෙරේරා මිය, කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

19 මහාචාර්ය ඩී.වී.පී.ප්‍රසාද, කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

20 මහාචාර්ය එම්.අයි.එම්.මවුජුඩ්,කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

21 ආචාර්ය යූ.අයි.දිසානායක මිය, කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

22 මහාචාර්ය ජේ.කේ.විදානාරච්චි මයා, සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

23 මහාචාර්ය බී.එම්.එල්.ඩී.බී.සුරියගොඩ, ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

24 ආචාර්ය එස්.ඩී.එස්.හේමචන්ද්‍ර, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

25 මහාචාර්ය සී.කේ.බෙනරගම,භෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

26 පී.සී.අරම්පත් මයා, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

27 මහාචාර්ය කේ.එස්.හේමචන්ද්‍ර, පැලැටි ආරක්ෂණ පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

28 මහාචාර්ය ආර්.එස්.ධර්මකීර්ති මයා, පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්

29 මහාචාර්ය එච්.පී.එම්.ගුණසේන, බෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, විද්‍යා නිධි පේරාදෙණිය විශ්වවිද්‍යාලය

30 මහාචාර්ය ආර්.පී.ද.සිල්වා,උපකුලපති, වෘත්තීය හා තාක්ෂණ විශ්වවිද්‍යාලය

31 ආචාර්ය එල්.එස්.කේ.හෙට්ටිආරච්චි, අධ්‍යක්ෂ, තේ පර්යේෂණ ආයතනය.

32 මහාචාර්ය ජී. මිකුන්තන්, කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය

33 මහාචාර්ය එම්.බී.රණතිලක, ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යාන අධ්‍යන අංශය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය

වගුව

		පිටුව
ආ .1	සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	06
ආ .2	පශ්චාත් උපාධි පාඨමාලා හදාරන දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු	07
ආ .3	උපාධි පාඨමාලාවල නියැලෙන විදේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	08
ඇ	කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු	09
ඈ. 1 (අ)	යොමුකරන ලද සඟරාවල (සුවිගත හා සුවිගත නොකළ) ප්‍රකාශන ලේඛණය - 2022	10
ඈ. 1 (ආ)	සුවිගත සඟරාවල පල කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා ලේඛණය - 2022	11
ඈ .2	2022 වර්ෂයේදී ලද ජාතික හා අන්තර් ජාතික සම්මාන	12
ඈ .3	2022 වර්ෂයේ පොදු ජනතාවට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳ තොරතුරු	13
ඉ. 1	පවත්වන ලද අන්තර්ජාතික සම්මාන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර	16
ඉ .2	2022 වර්ෂයේ දී උපාධි අපේක්ෂක පාඨමාලා ඉගැන්වීම් / පශ්චාත් උපාධි පාඨමාලා ඉගැන්වීම් / පරිසංවාද / වැඩමුලු සඳහා වූ ජාත්‍යන්තර කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු	16

වාර්ෂික වාර්තාව - 2022

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(2022 දෙසැම්බර් 31 දිනට)

(අ) හැඳින්වීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 01 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරණ වයවස්ථාව මඟින් 1975 වසරේ ජූනි මාසයේ දී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් බවට පත් කරන ලදි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධි විධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යවස්ථාව ආඥ පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 9 දරණ පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරි පළමු දින සිට ක්‍රියාත්මක තත්වයට පත් වි ආයතනගේ ක්‍රියාකරිත්වය සඳහා නීතිමය පදනම සකස්කර දෙනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් වර්ධනය කිරීම හා මෙරට ශීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතිය ආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු විය. මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පවති.

අධ්‍යයන වැඩසටහන්

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා වත්මන් ශ්‍රීලංකාවේ ආර්ථිකයට වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. රටේ ඉල්ලුමට උචිතවන පරිදි විෂයමාලාවන් ද සංශෝධනය කොට ඇති අතර වර්තමානය වන විට මෙම ආයතනය දර්ශණ ශූරී උපාධි ,ව්‍යාපාර පරිපාලන උපාධි සහා විද්‍යාපති උපාධි පාඨමාලාවන් 30 ක් පාඨමාලා කටයුතු සහ පර්යේෂණ ද ඇතුලත්ව පිරිනමනු ලබයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වල දී පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුකරයි. මේ තුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ විශ්ව විදයාල අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජන ගැනීමට සහ පර්යේෂණ වැඩ සටහන්වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට සැලකිය යුතු කාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයහි වැඩි ප්‍රාගුණ්‍යක් අත්කර ගැනීමට කැප වූ විනය ගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහි කිරීමේ වැදගත් අභියෝගයට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටී. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරින් තුළ ඔවුන්ගේ චරිතවල අවියෝජනීය වූ කොටසක් බවට පත්වන ප්‍රබල කාර්ය ආචාරධර්ම සමුදායක් සංවර්ධනය කිරීම මෙම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතික මාර්ගෝපදේශයන්ට සමාන වන ආකාරයෙන් මෙම ආයතනය දැනට පවතින රෙගුලාසි 2017 වසරේ සිට බලපැවැත් වන පරිදි සංශෝධනය කොට ඒ අනුව සිසුන් ඇතුළත් කරගන්නා ලදි. මෙම ආයතනය මඟින් ප්‍රදානය කෙරෙන උපාධි වැඩ සටහන් වන්නේ,

- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - සම්මාන පහක් ඉලක්ක කළ අධ්‍යයන/ව්‍යාපෘති පාඨමාලා වැඩ
- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - වසරක පර්යේෂණයක් ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණ
- දර්ශනපති / දර්ශණශූරී ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි - පර්යේෂණ පමණි

උක්ත විද්‍යාපති උපාධි සඳහා අදාළ සම්මාන අවශ්‍යතාවන් සපුරන අපේක්ෂකයින්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා සම්පූර්ණ කල හැකිය. සම්මාන 25ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සම්මාන 20ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත්

උපාධි සහතික පත්‍ර ද ලබාගත හැක. කෙටි කාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම අත්කරගැනීමට අවශ්‍ය කරන අපේක්ෂකයින් වෙනුවෙන් මෙම ආයතනය පශ්චාත් උපාධි සහතික පත්‍ර වැඩ සටහනක් හඳුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

ආචාර්ය මණ්ඩලය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුළුල් ඉගැන්වීමේ හා පර්යේෂණ අත්දැකීම්වලින් සමන්විත 300 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයට අයත්වන අතර ඉතිරි පිරිස විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් පීඨවලින් රජයේ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන, සංස්ථා, පෞද්ගලික අංශයේ ආයතන, අන්තර් ජාතික ආයතන හා රජයේ නොවන සංවිධානවලට අයත්වේ.

ශිෂ්‍ය ලියාපදිංචිය සහ උපාධි පිරිනැමීම

අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 511 දෙනෙකු 2022 වසරේ දී ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

විද්‍යාපති - 461 ව්‍යාපාර පරිපාලනපති - 29 දර්ශනපති - 10
දර්ශනශූරී - 08 අනියම් - 03

2022 වසරේ දී උපාධි ප්‍රදානෝත්සවයේදී සිසුන්ට උපාධි පිරිනමන ආකාරය පහත පරිදිය.

දර්ශනශූරී -16 දර්ශනපති- 14 විද්‍යාපති -156
ව්‍යාපාර පරිපාලනපති - 12 පශ්චාත් උපාධි ඩිප්ලෝමා-21

වාර්ෂික සම්මේලනය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සම්මේලනය යනු පර්යේෂකයන්ට කෘෂිකාර්මාන්ත සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ ඔවුන්ගේ විද්වත් පර්යේෂණ සොයාගැනීම් පුළුල් ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රජාවකට ඉදිරිපත් කිරීමට, සාකච්ඡා කිරීමට සහ බෙදා හැරීමට විද්‍යාත්මක සංසදයකි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 34 වැනි වාර්ෂික සම්මේලනය 2022 නොවැම්බර් 17 -18 දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේදී අතථ්‍ය සම්මන්ත්‍රණයක් ලෙස පැවැත්විණි.

එය පශ්චාත් උපාධි සිසුන්ට සහ අංකුර විද්‍යාඥයිනට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් විද්වතුන්, පර්යේෂකයන්, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ

ආදී සිසුන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සමන්විත අතථ්‍ය ප්‍රෙක්ෂක පිරිසකට ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් ලබා දුන්නේය. මෙම වසරේදී විද්‍යාත්මක සැසි 7ක යටතේ වාචික සහ පොස්ටර් ඉදිරිපත් කිරීම් 30 ක් සිදු කරන ලදි. වාචික තාක්ෂණික සැසි දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය සඳහා මෙවලම්, ශාක කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අණුක ප්‍රවිශයන්, නිෂ්පාදන හා නිෂ්පාදන වල පාඩු වැළැක්වීම, ආහාර පරිසරයේ සමාජ මානයන් සහ පස සහ ජල සම්පත් කළමණාකරණය සම්බන්ධයෙන් විය. කෘෂිකාර්මික හා වන විද්‍යාවේ සම්පත් කළමනාකරණය සහ කෘෂි කර්මාන්තයේ සමාජ ගුණාංග පිළිබඳ පෝස්ටර් සැසි පැවැත්විණි. සමාරම්භක සැසිය 2022 නොවැම්බර 18 වන දින පැවැත්වුණේ ඉතා සීමිත සහභාගීවන්නන් පිරිසක් සමඟිනි. සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස නෙදර්ලන්ත රාජධානියේ ශ්‍රී ලාංකාවේ සහ මාලදිවයිනේ නියෝජ්‍ය තානාපතිනි Anouk Baron මහත්මිය සහභාගි විය. ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ ව්‍යවසායක කෘෂිකාර්මික තාක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ කිර්තිමත් මහාචාර්ය ඕවන් ඇටකින් විසින්, "අනාගතය සඳහා දේශගුණයට සුදානම් භෝග සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණයේ දියුණුව භාවිතා කිරීම" පිළිබඳ ප්‍රධාන දේශනය පවත්වන ලදි. කැනඩාවේ එඩ්මන්ටන් හි ඇල්බර්ටා විශ්වවිද්‍යාලයේ මාධ්‍ය සහ තාක්ෂණ අධ්‍යයන වැඩබලන අධ්‍යක්ෂ මාහාචාර්ය ගෝර්ඩන් ඒ ගව් සහ ස්විස්ටර්ලන්තයේ ලින්ඩෝ හි කෘෂිකාර්ම විද්‍යා ආයතනයේ මහාචාර්ය එම්මානුවෙල් ෆ්‍රොසාඩ් ආරාධික දේශන පැවැත්වූහ.

34 වැනි වාර්ෂික සම්මේලනයේ සම්බන්ධීකාරක මහාචාර්ය ලසන්ත විරසිංහ සහ පශ්චාත් උපාධි ශිෂ්‍ය සංගමයේ (PASA) සභාපති ලහිරු චතුරංග යන මහත්වරු ද සමාරම්භක සැසියේදී අදහස් දැක්වූහ.

අංකුර විද්‍යාඥයින් විසින් සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම සහ විද්‍යාත්මක සොයාගැනීම් ඵලදායි ලෙස ව්‍යාප්ත කිරීම සඳහා, ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් සම්බන්ධ විවිධ මාතෘකා යටතේ පූර්ව සම්මේලන වැඩමුළු හතරක්ද පවත්වන ලදි. මෙම වැඩමුළු සහ තාක්ෂණික සැසි සඳහා විශාල පිරිසකගේ සහභාගිත්වයක් දක්නට ලැබිණි.

ආයතනික ව්‍යුහය



කෙටි යෙදුම්:

SAB – ජ්‍යෙෂඨ සහකාර මූල්‍යාධිකාරී

SAL- ජ්‍යෙෂඨ සහකාර පුස්තකාලාධිපතිනය

SA/P – පද්ධති විශ්ලේෂක

AR – සහකාර ලේඛකාධිකාරී

*අධ්‍යයන මණ්ඩල

කෘෂිකාර්මික ජීවවිද්‍යාව
කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව
කෘෂිකාර්මික ඉංජිනේරුකරණය
කෘෂිකාර්මික ව්‍යාප්තිය
සත්ව විද්‍යාව
ව්‍යාපාර පරිපාලනය
ජීව විද්‍යා සංඛ්‍යානය
බොග විද්‍යාව
ආහාර විද්‍යාව හා තාක්ෂණය
පැලෑටි ආරක්ෂණය
පංශු විද්‍යාව

(ආ) ජයග්‍රහණ

අචාර්ය ඒ.ඩබ්.අර්.ජෝකිම් අනුස්මරණ ත්‍යාග ප්‍රදානය

අවසන් වසර අවබෝධතා පරීක්ෂණයේදී සාර්ථකව මුහුණ දෙන ඉහළම GAP අගයක් ලබාගන්නා ප්‍රශංසනීය ශිෂ්‍යයාට ප්‍රදානය කරන්නකි. 2022 වර්ෂයේ නොවැම්බර් 17 වැනි දින පැවති 34 වැනි වාර්ෂික සමුළුවෙදී තම උපාධි පාඨමාලාවේ ඉහළම GAP අගය 4.00 ක් ලබාගත් පහත සඳහන් සිසුවියට මුදල් ත්‍යාගය පිරිනමන ලදි.

නම	අධ්‍යයන මණ්ඩලය	උපාධි පාඨමාලාව
ඩබ්.ඩී.ඊ්.පී.ඒ. විතාන	පාංශු විද්‍යාව	පාරිසරික පාංශු විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව

(ඇ) බාධක

සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කල්දැමීමට සිදුවූයේ කොවිඩ් වසංගත තත්වය මත අධ්‍යයන කටයුතු අතත්‍ය ක්‍රමයට පරිවර්තනය කිරීමේදී අවශ්‍ය වන මාර්ගගත පහසුකම් හා තාක්ෂණ දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමුකිරීමට සිදුවූ බැවිනි. තවද සිසුන්ගේ පර්යේෂණ කටයුතු නිමකිරීමට බාධා පැමිණි අතර එය උපාධිධාරී නිමැවුම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය.

(ඈ) අනාගත සැලසුම්

1 ආයතනයේ වෙබ් අඩවිය නිරන්තර යාවත්කාලීන කිරීම තුලින් දෘෂ්‍යතාවය වර්ධනය කිරීම සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුවත්පත් ලිපි/ කාලීන ප්‍රකාශන නියමිත කාල පරාසය තුල ප්‍රකාශනය කිරීම හා සාමාන්‍ය සහ විද්‍යුත් මාධ්‍ය හරහා ඒවා බෙදා හැරීම තුලින් සියළුම පාඨමාලා සඳහා වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ දැමීම.

2 තාක්ෂණික පහසුකම් සැපයීම සහ වැඩිදියුණු කරගැනීම මඟින් විදේශ විද්‍යාලවල අධ්‍යයන මණ්ඩල පර්යේෂණ මධ්‍යස්ථානවල සහ කර්මාන්තයේ වෘත්තිකයන්ගේ සේවය ලබාගැනීමට කටයුතු යෙදීම.

3 සුවිශත විද්‍යාත්මක සඟරාවල පළ කරගැනීමේ හැකියාව පුළුල් කරගැනීමටත්, දේශීය පළකිරීම් හැකියාව ශක්තිමත් කරගැනීමටත් පොදු ජනතාව උදෙසා තම පර්යේෂණ ඵල දැනුවත් කිරීමටත් පශ්චාත් උපාධි හදාරන සිසුන්ට පහසුකම් සැලසීම.

4 පශ්චාත් උපාධි හදාරන සිසුන්ගේ ඉගැන්වීම් හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම, අධ්‍යයන පාඨමාලා සංවර්ධනය සහ ඇඟයීම් කටයුතු ද නායකත්ව දියුණුව සඳහා අදාළ වන කෙටිකාලීන පුහුණු වැඩමුළු ලබාදීම වැනි කටයුතු සඳහා දේශීය හා විදේශීය වෘත්තිකයන්ගේ සහය ලබා ගැනීම.

5 පර්යේෂණ කෘති කොපිකිරීම හඳුනාගන්නා මෘදුකාංග පහසුකම්, උඩුගත කළ වීඩියෝ සමඟින් ඉගැන්වීම් හා ප්‍රතිඵලදායක ඉගෙනුම් පහසුකම් සහිත නවීන උපාංග සහිත ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් දියුණු කිරීම.

6 පශ්චාත් උපාධිය හදාරන සිසුන්ගේ සහ ඔවුන්ගේ අධීක්ෂකයන්ගේ විශිෂ්ය වූ පර්යේෂණ ව්‍යාපෘති මඟින් ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සඳහාත් බලපෑම කළ හැකි පර්යේෂණ කෘතීන් එළි දැක්වීම වෙනුවෙනුත් ඇගයීම.

7 බාහිර කාර්යමණ්ඩල සහ විදේශීය සිසුන් වෙනුවෙන් නවාතැන් පහසුකම් සහ විවේක ගැනීම් පහසුකම් සලසා දීම මූලික කොට ගත් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

8 කෘෂිකර්ම විද්‍යා පුස්තකාල සම්පත් ඩිජිටල්කරණය කිරීම

9 කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමටත් ආයතනයේ දිගුකාලීන තිරසාර සංවර්ධනය උදෙසාත් සේවකයින් සඳහා තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.මෙම සියළුම උපාය මර්ගික සැලසුම් ක්‍රියාත්මක කළ යුතු වන්නේ පරිසරය ආරක්ෂා කරමින් හා හානිය අවම කරමින් තිරසාර සංවර්ධන ප්‍රතිපත්තීන්ට සමගාමීව සියළු අදාළ පාර්ශවයන් දැනුවත් කරමිනි.

ආ) නවක ශිෂ්‍ය බඳවා ගැනීම්

ආ.1 . 2022 දෙසැම්බර් 31 වැනි දිනට සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	කාර්ය මණ්ඩල ව්‍යාප්තිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)			
		අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය	මුළු ගණන
අනියම්	03	2	39	1	42
දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ)	0				
දර්ශනපති (පාඨමාලා)	10				
විද්‍යාපති (පාඨමාලා)	370				
විද්‍යාපති (පාඨමාලා හා පර්යේෂණ)	91				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	23				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	6				
දර්ශනශූරී (පාඨමාලා හා පර්යේෂණ)	0				
දර්ශනශූරී (පර්යේෂණ)	8				
මුළු ගණන	**511**	**2**	**39**	**1**	**42**

ඇ.2. 2022 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යයන පාඨමාලාව	පූර්ණකාලීන/ අර්ධ කාලීන	නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2022)			ශිෂ්‍ය බඳවා ගැනීම (2022 දෙසැම්බර් දිනට ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව)			උපාධිධාරීන් සංඛ්‍යාව
		පිරිමි	ගැහැණු	මුළු ගණන	පිරිමි	ගැහැණු	මුළු ගණන	
අනියම්	අර්ධ කාලීන	0	3	3	3	3	3	0
දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ)	පූර්ණ කාලීන	0	0	0	9	15	24	2
දර්ශනපති (පර්යේෂණ)	පූර්ණ කාලීන	3	7	10	23	51	74	6
විද්‍යාපති (පාඨමාලා)	පූර්ණ කාලීන	105	265	370	427	978	1405	89
විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	32	59	91	83	216	299	5
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	පූර්ණ කාලීන	14	9	23	79	67	146	7
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	5	1	6	40	29	69	2
දර්ශනශූරී (පාඨමාලා හා පර්යේෂණ)	පූර්ණ කාලීන	0	0	0	1	5	6	0
දර්ශනශූරී (පර්යේෂණ)	පූර්ණ කාලීන	5	3	8	39	39	78	8
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	පූර්ණ කාලීන	0	0	0	0	0	0	0
මුළු එකතුව		**164**	**347**	**511**	**705**	**1403**	**2104**	**119**

ඇ.3. 2022 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ විදේශීය සිසුන් පිළිබඳ

අධ්‍යයන පාඨමාලාව	පූර්ණකාලීන/ අර්ධ කාලීන	නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2022)			ශිෂ්‍ය බඳවා ගැනීම (2022 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)		
		පිරිමි	ගැහැණු	මුළු ගණන	පිරිමි	ගැහැණු	මුළු ගණන
දර්ශනශූරි	පූර්ණ කාලීන					4	4
මුළු එකතුව						4	4



(ඇ) කාර්ය මණ්ඩල තොරතුරු

සේවා වර්ගය	වැටුප් කේතය	2017.12.31 දිනට අනුමත	දැනට සිටින සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම		19	
ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා නැති	PL-1		8
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ දක්ෂතා	PL-2		4
ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා	PL-3		3
ද්විතියික මට්ටම		21	
කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන	U-MN 1		15
කළමණාකාර සහකාර - තාක්ෂණික	U-MT 1		-
ආශ්‍රිත නිළධාරි - 2 වැනි කාණ්ඩය	U-MN 2		-
ආශ්‍රිත නිළධාරි - 1 වැනි කාණ්ඩය	U-MN 3		-
මාණ්ඩලික සහකාර / සුප්‍රා සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4		6
තෘතීය මට්ටම		2	
අධ්‍යයන සහකාර - 2 වැනි කාණ්ඩය	U-AS 1		-
කණිෂ්ඨ විධායක/ කළමණාකරු	U-EX 1		1
අධ්‍යයන සහකාර	U-AS 2		1
ජ්‍යෙෂ්ඨ මට්ටම		11	
වෛද්‍ය නිළධාරි	U-MO 1		
ප්‍රධාන වෛද්‍ය නිළධාරි	U-MO 2		
මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින්	U-EX 2		1
මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින්	U-EX 2 (a)		1
ජ්‍යෙෂ්ඨ විධායක නිළධාරින්	U-EX 3		
කථිකාචාර්ය	U-AC 3		10
ආශ්‍රිත මහාචාර්ය	U-AC 4		-
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5		1

(ඈ) පර්යේෂණ නිමවුම් දත්ත

ඈ. 1. 2022 වර්ෂයේ ප්‍රකාශක නිමවුම් - කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) අධ්‍යක්ෂ හැර මෙම ආයතනයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති හෙයින් ආයතනයේ සියලුම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉටු කරනු ලබයි. ඔවුන්ගේ ප්‍රකාශන සාමාන්‍යයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය යටතේ ලැයිස්තුගත කර ඇත.

ඈ.1.(අ) 2022 දී යොමුකරන ලද (සුචිගත සහ සුචිගත නොකළ) සඟරාවල ප්‍රකාශන ලැයිස්තුව

පීඨය	ප්‍රකාශන වර්ගය	සංඛ්‍යාව		වෙනත් කරුණු
		ප්‍රකාශිත දේශීය	ප්‍රකාශිත විදේශීය	
PGIA	සුචිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව		4 2 2	ආචාර්ය එච්.එම්.එස්.වාසනා ආචාර්ය ඩී.එන්. බලගල්ල එස්.පී මිහිඳුකුලසුරිය
	සුචිගත නොකරන ලද සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව			
	යොමු නොකළ සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව			
PGIA	සමුළු ලේඛනවල සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා වශයෙන් පළ කරන ලද සමුළු පර්යේෂණ සංඛ්‍යාව		1	ආචාර්ය එච්.එම්.එස්.වාසනා
PGIA	සංක්ෂිප්ත පළකිරීමේ සංඛ්‍යාව		2	ආචාර්ය එච්.එම්.එස්.වාසනා
	පුස්තක ඡේද පළකිරීමේ සංඛ්‍යාව			
	ප්‍රකාශිත පොත් ගණන	ප්‍රකාශක විසින්		
		කතෘ විසින්		

ඇ.1.(ආ) සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ වර්තා - 2022

සමාලෝචිත වර්ෂයේදී, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් විසින් පහත සඳහන් ප්‍රකාශනයන් Tropical Agricultural Research සඟරාවේ පළ කරන ලදි. මෙම සඟරාව 1989 පටන් ආයතනය විසින්ම පළ කරන සඟරාවකි.

පර්යේෂණ ලිපියේ නම	කතෘන්ගේ නම	සම කතෘන්
නිවර්තන ගොවිතැන් ක්‍රම යටතේ බඩ ඉරහු, මුං ඇට සහ තක්කාලි වල ඖනොලෝජී,වියන් වර්ධන සහ අස්වැන්න අනුකරණය කිරීම සඳහා ආකෘතිකයක් සංවර්ධනය කිරීම සහ වලංගු කිරීම.	ජේ.බි.ඩි.ඒ.පී.කුමාර	එල්.ඩී.බී.සුරියගොඩ, ඩබ්.ඒ.ජේ.එම්.ද. කොස්තා,එම්.ස්.පී.ඩබ්.කේ. මලවි ආරච්චි, කේ.එම්.ආර්.ඩි.අභයපාල, ආර්.එම්.එස්. පෝන්සේකා
ශ්‍රී ලංකාවේ එකිනෙකට වෙනස් එළවළු වගා පද්ධති දෙකක පාංශු රසායනික ලක්ෂණ සංසන්දනාත්මක තක්සේරුව	එච්.ඒ.එන්.උපෙක්ෂානී	ආර්.එස්.ධර්මකීර්ති, පී.වීරසිංහ, ඩබ්.එස්.දන්දෙනිය
අනෙකුත් කේෂත්‍ර භෝග වගා කරන ගොවීන් දේශගුණික විචල්‍යතාවයට ගොදුරු වීමේ අවදානම ශ්‍රී ලංකාවේ අනුරාධපුරයේ පලුගස්වැව කඳුරැල්ල සහ මහවැලි පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්.	එස්.ඩී.එන්.එම්. සේනාධීර	එන්.ඩී.කේ.දයාවංශ, ආර්.පී. ද සිල්වා
Gyrinops walla වේගයෙන් ගුණ කිරීම සඳහා ද්‍රව සංස්කෘතික පද්ධතිය සංවර්ධනය කිරීම.	ඩී.බී.ආර්.කෞෂල්‍යා	ජේ.පී. ඊශ්වර, එල්.ජයසිංහ
ශ්‍රී ලංකාවේ උක් අභිජනනය සඳහා Saccharum Germpasm ඇගයීම සහ ලක්ෂණ.	ඒ.එම්.එම්.එස්. පෙරේරා	ඒ.විජේසුරිය,ඒ.එන්.ඩබ්ලිව්.එස්.තුෂාරි, ඩී.පී.එස්.ටී.ජී.අත්තනායක, එන්.ඩී.විජේසුරිය
ශ්‍රී ලංකාවේ Cinnamomum විශේෂය සංලක්ෂිත කිරීම සඳහා අන්තර් සරල අනුක්‍රමික පුනරාවර්තන කාලාප, පොතු කුඩු රූප විද්‍යාව සහ මල් රූපමිතිය භාවිතා කිරීමේ හැකියාව.	එච්.ඒ.බී.එම්. හතුරුසිංහ	බී.එස්.බන්දුසේකර,ඩී.කේ.එන්.ජී. පුෂ්ප කුමාර, ආර්.ඒ.ඒ.කේ.රණවක, පී.සී.ජී.බණ්ඩාරණායක

(ඇ).2. 2022 දී ලද ජාතික හා ජාත්‍යන්තර සම්මාන
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සමුළුව-2022

සැසිය	ත්‍යාගය/හොඳම නිබන්ධ පර්යේෂණ කළු ත්‍යාගය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නම සහ අරමුණ	ජාතික/අන්තර්ජාතික	නම/ නම්	තනතුර	සිය/ දෙපාර්තමේන්තුව
කෘෂිකාර්මය සහ වනාන්තරහි සම්පත් කළමණාකරණය	හොඳම ප්‍රදර්ශනය	ජාතික	පී.ඒ.එම්.ඩයස්	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කෘෂිකර්මාන්තයේ සමාජීය ගුණාංග	හොඳම ප්‍රදර්ශනය	ජාතික	ඩබ්ලිව්.සී.එස්.වනසිංහ	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මය සඳහා උපකරණයක්	හොඳම වාචික ඉදිරිපත් කිරීම	ජාතික	ජේ.බී.ඩී.ඒ.පී.කුමාර	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
භෝග ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමේ අණුක ශිල්පීය ක්‍රම	හොඳම වාචික ඉදිරිපත් කිරීම	ජාතික	කේ.ඒ.පී.දල්පතාදු	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
නිෂ්පාදනයේ සහ නිෂ්පාදන වල පාඩුව සීමා කිරීම	හොඳම වාචික ඉදිරිපත් කිරීම	ජාතික	බී.එස්.බන්දුසේකර	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ආහාර සහ පරිසරයේ සමාජ මානයන්	හොඳම වාචික ඉදිරිපත් කිරීම		ඩබ්ලිව්.ඒ.එම්.ලොව්	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පාංශු සහ ජල සම්පත් කළමණාකරණය	හොඳම වාචික ඉදිරිපත් කිරීම	ජාතික	පී.කෞෂල්‍යානි	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - තුන්වන ස්ථානය	ජාතික	බී.එස්.බන්දුසේකර	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - දෙවන ස්ථානය	ජාතික	පී.කෞෂල්‍යානි	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - ප්‍රථම ස්ථානය	ජාතික	ජේ.බී.ඩී.ඒ.පී.කුමාර	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

සැසිය	කාර්ය	ජාතික /අන්තර් ජාතික බව	ඉදිරිපත් කරන්නාගේ නම /නම්	තනතුර	ඒකය/ දෙපාර්තමේන්තුව
සමස්ථ හොඳම ඉදිරිපත් කිරීම	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	ජේ.බී.ඩී.ඒ.පී. කුමාර	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
හන්තාන එසෙන්ස්	හන්තාන එසෙන්ස්- තුන්වන ස්ථානය	ජාතික	එච්.එම්.පී.එස්.කුමාරි	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
හන්තාන එසෙන්ස්	හන්තාන එසෙන්ස් - දෙවන ස්ථානය	ජාතික	එච්.ඒ.එන්.උපෙක්ෂානී	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
හන්තාන එසෙන්ස්	හන්තාන එසෙන්ස් - පළමු ස්ථානය	ජාතික	එස්.ඒ.ඩී.තක්ෂිලා	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

ඇ.3 2022 වර්ෂය තුළ මහ ජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ විස්තර

ආයතනය	මාධ්‍ය වැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර දර්ශනයන්/මාධ්‍ය වැඩසටහන්	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම සිදුවූ/දෙපාර්තමේන්තු ව/මධ්‍යස්ථාන ඒකකය	පැවැත්වූ දිනය	කාලය	ඉලක්කගත කණ්ඩායම්	සහභාගී වූවන් සංඛ්‍යාව
කැප් නෙට් ලංකා	පුහුණු වැඩමුළු (2)	වැසි ජලය රැස්කිරීමේ පද්ධතිය ඉදිකිරීම පිළිබඳ තරුණ පුහුණු වැඩසටහන	Cap -Net Lanka සහ වැසි ජලය රැස් කිරීමේ සංසදය (LRWHF), ශ්‍රී ලංකාව	2022 මාර්තු 3 -5	දින 03	තරුණ ප්‍රජාව	47
කැප් නෙට් ලංකා	දැනුවත් කිරීමේ වැඩසටහන්	ලෝක ජල දිනය (WWD) -2022 නිමිත්තෙන් කැප් නෙට් ලංකා දැනුවත් කිරීමේ වැඩසටහන සහ චිත්‍ර තරඟය	Cap - Net Lanka & කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අන්තර් ජාතික පුහුණු ආයතනය (KITI-IWM)'ශ්‍රී ලංකාව ආයතනය	2022 මාර්තු 22	එක් දින	KITI හි පාසැල් සිසුන් ඩිප්ලෝමා සිසුන් සහ ගුරුවරු	78

ආයතනය	වැඩසටහන් වර්ගය/වැඩමුළු/හුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/ මාධ්‍ය වැඩසටහන්	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම සිදුවූ/දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථාන ඒකකය	පැවැත්වූ දිනය	කාලය	ඉලක්ෂගත කණ්ඩායම්	සහභාගි වූවන් සංඛ්‍යාව
කැප් නෙට් ලංකා	පුහුණු වැඩමුළු	කුඩා කට්ටි වශයෙන් උණ බම්බු වගාකිරීම තුලින් පාංශු ඛාදනය පාලනය කිරීම හා ජල සුරක්ෂිතතාවය ඇති කිරීම පිළිබඳව කුඩා ඉඩම් හිමියන් සඳහා වූ පුහුණු වැඩමුළුව	කැප්නෙට් ලංකා සහ ලංකා සංවර්ධන නවෝත්පාදන සන්ධානය සඳහා පර්යේෂණ ආයතනය(REDI) පොල්ගස්ඕවිට ශ්‍රී ලංකාව	29 ජූලි 2022	එක් දින	මහනුවර ප්‍රදේශයේ වයස අවුරුදු 18 - 28 අතර තරුණ/ තරුණියන්	22
කැප් නෙට් ලංකා	ජාතික සම්මන්ත්‍රණය	ප්‍රජා ජල සැපයුමේ ඉගෙනුම හුවමාරුව සඳහා වූ ජාතික සම්මන්ත්‍රණය	කැප් නෙට් ලංකා සහ ව(ර්)ඩ් විෂන් (WVL),කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,වැවිලි මානව සංවර්ධන භාරය (PHDT), ජතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව(DNCWS) සහ ලංකා ජලනි (SLWP)	2022 සැප්තැම්බර් 12	එක් දින	ජල අංශයේ වෘත්තිකයින්, අධ්‍යයන /පර්යේෂකයින්,රජයේ නිලධාරීන්, රාජ්‍ය ජල අංශයේ සේවා නියුක්තිකයන්, ලාභ පරමාර්ථ නැති / රාජ්‍ය නොවන / අන්තර් ජාතික ආයතන	119

ආයතනය	වැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/ මාධ්‍ය වැඩසටහන්	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම සිදුවේ/දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථාන ලැයිස්තුව	පැවැත්වූ දිනය	කාලය	ඉලක්කගත කණ්ඩායම	සහභාගී වූවන් සංඛ්‍යාව
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	වැඩමුළුව	සංඛ්‍යාන විශ්ලේෂණ පද්ධතිය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය	කෘෂිකර්ම පශ්චාත් උපාධී ආයතනය	2022 ජූනි 3,4,10, 11,17	පස් දින	පශ්චාත් උපාධි හදාරණ සිසුන්	30
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	වැඩමුළුව	පර්යේෂණ දත්ත ඉදිරිපත් කිරීමේ ක්‍රම	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	2022 ජූලි 04	එක් දින	විවෘත	27
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	වැඩමුළුව	ඵලදායී පර්යේෂණ පත්‍රිකා ලිවීම	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	2022 අගෝස්තු 20	එක්දින	විවෘත(උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධි හදාරණ සිසුන්) හා ආචාර්ය මණ්ඩලය	63
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	වැඩමුළුව	ඵලදායී පර්යේෂණ ඉදිරිපත් කිරමේ කුසලතා	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධී ආයතනය	2022 නොවැම්බර 02	එක් දින	විවෘත(උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධි හදාරණ සිසුන්)	38

ආයතනය	වැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/ මාධ්‍ය වැඩසටහන්	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම සීඨය/දෙපාර්තමේන්තුව/මධ්‍ය ස්ථාන ඒකකය	පැවැත්වූ දිනය	කාලය	ඉලක්කගත කණ්ඩායම්	සහභාගී ධුවන් සංඛ්‍යාව
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ,PASA(කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ධාරින්ගේ සංගමය	ක්‍රියා මාලාව	ලේ දන්දීම	කෘෂිකර්ම සීඨය	2022 ඔක්තෝබර් 13	එක්දින	සිසුන් හා ආචාර්ය මණ්ඩලය	250
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	කෙටි පාඨමාලාව	කෘෂිකාර්මික ව්‍යාප්තිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාරකාරත්වය	කෘෂිකාර්මික ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය	සැප්තැම්බර් 06 සිට නොවැම්බර් 15 දක්වා	සති 10 යි	රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාප්ති වෘත්තිකයන්	29

(ඉ) ජාත්‍යන්තරීකරණය

(ඉ) (1) 2022 වර්ෂයේදී ආයතනය විසින් පවත්වන ලද අන්තර්ජාතික සමුළු සහ වැඩමුළු පිළිබඳ විස්තර

අංකය	නේමාව	සංවිධානය කිරීම (සීඨය/අධ්‍යයන අංශය/ මධ්‍යස්ථානය/ඒකකය)	පැවැත්වූ දිනය/ කාලසීමාව	ඉලක්කගත කණ්ඩායම	සහභාගිවුවන් සංඛ්‍යාව
1	වාර්ෂික සම්මේලනය	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	2022 නොවැම්බර් 18	සිසුන්	200

(ඉ) (2) 2022 වර්ෂයේදී ප්‍රථම උපාධි සඳහා ඉගැන්වීම/ පශ්චාත් උපාධි ඉගැන්වීම/සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා අන්තර්ජාතික කාර්ය මණ්ඩල පැමිණීම පිළිබඳ තොරතුරු

ආයතනය	වැඩසටහනේ නම	රට	කාර්ය මණ්ඩලය
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	ඉන්දියාව	01
		නයිජීරියාව	01

ඊ. **2022 වර්ෂය සඳහා ඉලක්ක කරන ලද තිරසාර බව බැඳුණු වැඩසටහන්.**

1. පරිසරය හා සම්බන්ධ කෙටිකාලීන පාඨමාලා සහ වැඩසටහන් පැවත්වීම. උදාහරණ වැසි ජලයේන් වගා කිරීමේ ක්‍රම, පාංශු බාදනය පාලනය හා ජල සුරක්ෂිතතාවය.

2. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සූර්ය බලශක්ති (පිරිසිදු බලශක්ති) ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

3. හැකිතාක් දුරට ඩිජිටල් කළ පිටපත් තබා ගැනීමට උනන්දු කිරීම, ලිපි ද්‍රව්‍ය (ලියුම් කවර සහ කඩදාසි) නැවත භාවිතා කිරීම සහ අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා නාස්තිය අවම කිරීම.

4. කඩදාසි රහිත මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රියාවලිය සහ සරල කළ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ප්‍රවර්ධනය/දිරිමත් කිරීම.

5. තිරසාරත්වය සම්බන්ධ පාඨමාලා 100 කට වඩා පිරිනැමීමට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාඨමාලා මොඩියුල පවත්වාගෙන යාම.

6. විද්‍යුත් තැපෑල, කළමණාකරණ තොරතුරු පද්ධති සහ කෙටි පණිවිඩ සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා කඩදාසි රහිත ඵලදායී සන්නිවේදන පද්ධතියක් හඳුන්වා දීම.

කෘෂිකර්ම පුස්තකාලය

වාර්ෂික වාර්තාව - 2022

2022 දී ලද පුස්තකාල ප්‍රතිපාදන .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලද ප්‍රතිපාදනය	රු. 500,000,00
පීඨයෙන් ලද ප්‍රතිපාදනය	රු. 180,440.88
මුළු ප්‍රතිපාදනය	රු. 680,440.88

මිලදී ගැනීම් - පොත්

2022 වර්ෂයේදී කෘෂිකර්ම පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් තම ආයතනවල ඉගැන්වීම් කාර්ය සඳහා ගැලපෙන පරිදි නිර්දේශ කරන ලද පෙළපොත් වලින් සමන්විත පොත් 14ක් පුස්තකාල පොත් එකතුවට එකතු කරන ලදි.

එකතුවට අළුතින් එකතු කරන ලද පොත්වල විස්තර .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුදල් වලින් මිලදි ගත් පොත් ගණන	පොත් 08
වටිනාකම	රු, 56,890.00
පීඨ ප්‍රතිපාදන මගින් මිලදි ගත් පොත් ගණන	පොත් 06
වටිනාකම	රු, 49,290.00
මිලදි ගත් මුළු පොත් ගණන (කෘ.ප.උ.ආ සහ පීඨය)	පොත් 14
එකතුවට එක්වූ කෘ.ප.උ.ආ. නිබන්ධන ගණන	07

පරිත්‍යාග

වෙනත් පරිත්‍යාග ශිලින්ගෙන් ලැබුණු පොත් ගණන	86
වටිනාකම	රු. 32,083.50

වර්ෂය තුල පොත් සහ වාර සඟරා පරිත්‍යාග කළ වැදගත් පරිත්‍යාගශීලින්

පරිත්‍යාගශීලියා	වටිනාකම
සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ	රු. 1,148.00
හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනය, කොළඹ	රු. 7,060.50

වාර සඟරා

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් මගින් වාර් සඟරා මාතෘකා එකක් සඳහා 2022 වර්ෂයෙදී දායකත්වය සපයන ලදි.

පුස්තකාල පරිශීලක කාණ්ඩ

2022 දි ලියාපදිංචි පුස්තකාල පරිශීලකයින් 2618 ක් විය . විස්තර පහත දැක්වේ .

පශ්චාත් උපාධි සිසුන්	1084
උපාධි අපේක්ෂකයින්	1392
අධ්‍යයන කාර්යය මණ්ඩලය (ස්ථිර)	127
අධ්‍යයන කර්යය මණ්ඩලය (තාවකාලික)	11
සම්මානික මහාචාර්ය	01
බාහිර කථිකාචාර්ය	01
ලිපිකාර හා සමාන්තර සේවා	02
මුළු ගණන	2618

පුස්තකාල පොත් භාවිතය

බැහැර ෙගන යන ලද අයිතම ගණන	- 328
විමර්ශනය සඳහා ගත් අයිතම ගණන	- 08
අැතුලතදී **භාවිත** කරණ ලද අයිතම ගණන	- 574

අන්තර් පුස්තකාල ණය .

වෙනත් පුස්තකාලවලින් ලිපි ඉල්ලා අයදුම් 37 ක් ලැබුණි.
අපි ලිපි 31 ක් වෙනත් පුස්තකාලවලට යැව්වෙමු.

අපි ලිපි දෙකක් වෙනත් පුස්තකාලවලින් ඉල්ලා සිටියෙමු.
අප වෙත ලිපි දෙකක් වෙනත් පුස්කාලවලින් ලැබිණි.

සාහිත්‍ය කරුණු සෙවීම

පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සිසුන් විසින් සාහිත්‍ය කරුණු සෙවීම සඳහා CAB CD – ROM දත්ත පදනම භාවිතා කරනු ලබයි. 2022 වර්ෂය තුලදි CAB සෙවීම 2ක් සිදු කරණ ලදි.

කාර්යය මණ්ඩලය සහභාගි වූ පුහුණු/ වැඩමුළු

<u>පුස්තකාල දිශාභිමුඛ කිරිම සහ අනෙකුත් පුහුණු වැඩමුළු</u>

අනු අංකය	දිනය	තනතුර	කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව
01	11.02.2022	පුස්තකාල සහායක	02

<u>පුස්තකාල දිශාමුඛ කිරීමේ (Orientation) වැඩමුළුව</u>

අනු අංකය	දිනය	ස්ථානය	සිසුන් සංඛ්‍යාව
01	25.01.2022	මහඉල්ලුප්පල්ලම මණ්ඩපය	316
02	19.02.2022	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	493
03	05.09.2022	මහඉල්ලුප්පල්ලම මණ්ඩපය	235

<u>පුස්තකාල පුහුණු වැඩමුළු (තොරතුරු සාක්ෂරතාවය)</u>

අනු අංකය	දිනය	දෙපාර්තමේන්තුව	මාතෘකාව	සිසුන් සංඛ්‍යාව
01	05.05.2022	කෘෂිකාර්මික ජීවවිද්‍යාව	තොරතුරු සාක්ෂරතාවය	4 වෙනි වසර සිසුන්
02	31.05.2022	ආහාර විද්‍යාව සහ තාක්ෂණය	ආහාර විද්‍යාව සඳහා රසායනික තොරතුරු	34

එච්.එන්.කේ.දිසානායක මිය.
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති/ කෘෂිකර්ම පුස්තකාලය
04.01.2023

13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂය	2020 (රු.)		2021 (රු.)		2022 (රු.)	
	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය
අ)පුද්ගලික පඩිනඩි	**93,491,000**	78,037,775	**102,168,100**	78,873,620	**107,257,000**	112,961,174
ආ) ගමන් වියදම්	**55,000**	23,749	**20,000**	17,990	**15,000**	7,910
ඇ) සැපයීම්	**2,055,000**	1,578,481	**2,715,000**	1,129,825	**3,950,000**	2,283,400
ඈ) නඩත්තු	**1,255,000**	1,023,460	**1,485,000**	1,571,422	**1,700,000**	2,167,828
ඉ)කොන්ත්‍රාත් සේවා	**6,785,000**	6,512,824	**5,755,000**	5,624,481	**6,925,000**	7,092,112
ඊ) වෙනත්	**18,114,000**	35,634,398	**17,748,000**	35,524,141	**42,346,531**	50,679,688
එකතුව	**121,755,000**	**122,810,687**	**129,891,100**	**122,741,479**	**162,193,531**	**175,192,112**
මූල්‍ය ප්‍රභවය:						
රජයේ ප්‍රතිපාදන		**58,500,000**		**64,507,000**		**52,411,000**
%ක් වශයෙන්		**48%**		**53%**		**30%**
උත්පාදනය කළ මුදල්		**64,310,687**		**58,234,479**		**112.781,112**
%ක් වශයෙන්		**52%**		**47%**		**70%**

2022 වර්ෂයේදී ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 52.4 ක් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන නොමැත. එය පසුගිය වසරේ පුනරාවර්තන ප්‍රතිපාදනවලට සාපේක්ෂව රුපියල් මිලියන 12.1 ක පමණ අඩුවීමක් විය. මෙම වසරේ මුළු සත්‍ය පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 175.19 සහ රුපියල් මිලියන 31.72 කි. මුළු පුනරාවර්තන වියදම් මූලික වශයෙන් ජනනය කරන ලද අරමුදල් (70%) සහ ඉතිරිය ඒකාබද්ධ අරමුදල (30%) මගින් මූල්‍යකරණය කරන ලදී. පුනරාවර්තන වියදම්වලින් 64.48%ක් ස්ථීර කාර්ය මණ්ඩලයේ හා කථිකාචාර්යවරුන්ගේ වැටුප් හා වේතන ද ඇතුලත්ව පුද්ගලික පඩිනඩි සහ බාහිර දේශන ගාස්තු සඳහා වේ. පාඨමාලා ද්‍රව්‍ය, විශේෂ සේවා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ගමන් වියදම්, වාර්ෂික සම්මේලනය යනාදී ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම්. සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදමෙන් 28.93% ක් පමණ වේ. පුනරාවර්තන වියදම්වල සංයුතිය ඉහත සටහනේ දක්වා ඇත.


පුනරාවර්තන වියදම් සංයුතිය - 2022
ඊ) වෙනත්
28.93%
අ) පුද්ගලික පඩිනඩි
64.48%
ඉ) කොන්ත්‍රාත් සේවා
4.05%
ඇ) නඩත්තු
1.24%
ඈ) සැපයුම්
1.30%
ආ) ගමන් වියදම්
0.00%

14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂය	2020 (රු.)			2021 (රු.)			2022 (රු.)		
	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අ
අ) ගොඩනැගිලි හා ව්‍යූහ ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම්	**3,000,000**	-	97,035	-	-	-	**5,000,000**	-	4,8
ආ) රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ අත්පත් කර ගැනීම	**8,000,000**	500,000	5,724,115	**1,000,000**	-	108,392	**13,500,000**	-	14,7
ඇ) ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම	**3,000,000**	-	1,559,095	**8,850,000**	-	4,213,147	**7,000,000**	-	3
ඈ) වෙනත් - පුස්තකාල පොත් හා වාර සඟරා	**250,000**	-	163,709	**500,000**	-	273,124	**300,000**	-	
ඉ) පරිගණක සහ මෘදුකාංග	**6,700,000**	-	5,909,605	**14,500,000**	3,800,000	11,209,708	**15,000,000**	-	11,6
ඊ) ක්‍රීඩා උපකරණ	**150,000**	-	12,480	**60,000**	-	-	-	-	
එකතුව	**21,100,000**	500,000	13,466,038	**24,910,000**	3,800,000	15,804,371	**34,500,000**	-	31,7

ප්‍රාග්ධන ආයෝජනයෙන් 15.26% ක් එනම් රුපියල් මිලියන 5.00 කට ආසන්න මුදලක් ආයතනයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සඳහා වූ අතර සත්‍ය ප්‍රාග්ධන වියදමෙන් 84.54% ක් එනම් රුපියල් මිලියන 26.83 කට ආසන්න මුදලක් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම, පන්ති කාමරවල සහ පරිගණක විද්‍යාගාරවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී. තවද ආයතනයේ කෘෂිකාර්මික පුස්තකාලය සඳහා පොත් සහ වාර සඟරා අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 0.06 කට ආසන්න මුදලක් වැය කරන ලදී. ප්‍රාග්ධන වියදම් සංයුතිය ඉහත රූපයේ දක්වා ඇත.

ප්‍රාග්ධන වියදම් සංයුතිය - 2022



පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ හෙලිදරව් කිරීම.

1). පොදු කරුණු

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරණ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 12(3)(ඉ) සහ 19(1) සහ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාලපනතේ අංක 106(1) සහ 107(ආ) වගන්ති සහ ඉන්පසුව නීති ප්‍රකාරව කරන ලද සංශෝධන හා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත.

2) **අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

2.1 ගිණුම්කරණයට මුල් වූ පදනම

මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වලින් (මූල්‍ය ප්‍රකාශන) සමන්විත ආයතනයේ මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, පිළිවෙලින් 2009,2012 සහ 2018 වර්ෂයන්හිදී ප්‍රකාශයට පත්තරන ලද අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ඉ , II හා ඉඉI වන වෙළුම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද උපදෙස්මාලාව අනුව උපචිත පදනම මත පිළියෙල කොට ඇත.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී පසුගිය වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිම අනුගමනය කොට ඇත. අවශ්‍ය තැන් වලදී ,විමර්ෂණයට භාජනය කරනු ලබන වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ගැලපුම් කොට ඇත. නමුත් ගිණුම් වලට බලපාන්නා වූ උද්ධමනාත්මක සාධක සඳහා ගැලපුම් සිදුකොට නොමැත.

3) **දේපළ , පිරියත හා උපකරණ**

3.1 දේපළ, පිරියත හා උපකරණ එහි ප්‍රත්‍යාගණන අගය අනුව වාර්තා කොට ඇති අතර ක්ෂය වීම් 1995 ඔක්තෝබර් 05 අංක 649 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය ප්‍රකාරව ගණනය කොට ඇත. මූල්‍ය කාර්යය සාධන වාර්තාවටම මෙම ක්ෂය වීම් සරල මාර්ග පදනම මත ගණනය කොට ඇත.

එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛ විධිවිධාන පරිදි දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂය අනුපාත තීරණය කොට ඇත.

දේපදේපළ, පිරියත හා උපකරණ		ක්ෂය වීමේ අගය (වර්ෂයකට ප්‍රතිශතයක් ලෙස)
1. ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	05
2. කාර්යාලයීය උපකරණ	-	20
3. පරිගණක සහ මෘදුකාංග	-	20
4. ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	-	10
5. රසායනාගාර , ඉගැන්වීම් හා කාර්යාලයීය උපකරණ	-	20
6. මෝටර් රථ	-	20
7. පුස්තකාල පොත් සහ වාර සඟරා	-	20
8. ක්‍රීඩා උපකරණ	-	20
9. භූමි අලංකාර ව්‍යාපෘතිය	-	05
10. ජනක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධති	-	10
11. ජලාපවහන මා මලාපවහන පද්ධති	-	10

යම් වත්කමක් භාවිතයට ගැනීමේ ආරම්භයක් සමඟම එය ක්ෂය වීමට පටන් ගන්නා අතර , එකී වත්කම විකිණීමට හෝ හඳුනානොගැනීමට තීරණය කරනු ලබන දිනවලින් කළින් එළැඹි දින සිට එම ක්ෂය වීම් නවතී.

3.2 කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇති බැවින් මෙම ආයතනය පිහිටි භූමියේ අයිතිය නීත්‍යානුකූලව එයට පවරා ගෙන නොමැත. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී එකී ඉඩමේ වටිනාකම සැලකිල්ලට ගෙන නොමැත.ගොඩනැගිලි වටිනාකම රු.118,939,421.95 ක් ලෙස මූල්‍ය වාර්තාවල පමණක් සඳහන්කර ඇත.

3.3 දේපල, පිරියත සහ උපකරණ 2022.01.01 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව පන්තිය අනුව වෙන වෙනම ප්‍රත්‍යාගණන කරන ලද අතර රු. 36,361,026.48 ක් ප්‍රත්‍යාගණන අතිරිත්තයක් ඇත, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 විස්තරාත්මක සංඛ්‍යාලේඛනවලට අනුව, වත්කම්වල ප්‍රත්‍යාගණන කරන ලද ප්‍රමාණයන් මත පදනම් වූ ක්ෂයවීම් සහ වත්කම්වල මුල් පිරිවැය මත පදනම් වූ ක්ෂයවීම් අතර වෙනස ලෙස 2022.12.31 දිනට ප්‍රත්‍යාගණන අතිරික්තය මත ක්‍රමක්ෂය කිරීම හඳුනාගෙන ඇත. සටහන අංක 07 හි පැහැදිලි කර ඇත.

3.4 පර්යේෂණ ප්‍රදානය මුදල් උපයෝගි කරගෙන මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් ඉන්වෙන්ටරියේ ඇතුළත් කර ඇති නමුත් ප්‍රදාන කාල සීමාව අවසානයේ වත්කම්වල හිමිකාරිත්වය පී.පී.අයි වෙත පැවරෙන්නේ නැති බැවින් ස්ථාවර වත්කම් ලේඛනය ඇතුලත් නොවේ. ශේෂය යාවත්කාලීනව තබා ගැනීම සඳහා වියදම් අදාළ පර්යේෂණ ප්‍රදාන ගිණුමේ සටහන් කර ඇත. පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ විස්තර සටහන එෆ් හි ඇතුලත්ව ඇත.

4. ජංගම වත්කම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස සඳහන් වත්කම් යන්නට මුදල් සහ බැංකු ශේෂ සහ ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ වාර්තාකරනු ලබන දින සිට වසරක් ඇතුළත යන අවස්ථා දෙකෙන් වඩා කෙටිකාලයක් තුළ උප ලබ්ධි වන් ඇතැයි අපේක්ෂිත චෙක්පත් ආදී සියල්ල ඇතුළත් වේ.

4.1 **බඩු වට්ටෝරු පොත් සහ තොග**

බඩු වට්ටෝරු පොත් සහ තොගවල වටිනාකම තත්‍ය පිරිවැයට අනුකූලව තක්සේරු කරනු ලැබේ. ප්‍රථමයෙන්ම ලැබ ප්‍රථමයෙන්ම නිකුත් කිරීමේ (First- In, First – Out) පදනම මත පිරිවැය ගණනය කරනු ලැබේ. ගිණුම් වල සඳහන් තොග ශේෂයන් තොග ගැනීමක් වශයෙන් සත්‍යාපනය කරන ලදී.

4.2 **වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දෑ සාක්ෂාත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයන්හි දක්වා ඇත.

4.2.1 **ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 අනුව ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය සකස් කර ඇත.

උපලබ්ධි විය හැකි යැයි ඇස්තමේන්තු කරනලද ප්‍රමාණයන්ගෙන් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ මෙහි සඳහන් කර ඇත. අදාළ කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ශාස්තු වලින් ලද ආදායම හඳුනා ගනු ඇත. ඒ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා , විද්‍යාපති (MSc) , දර්ශනපති (M.Phil) , ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (MBA) සහ දර්ශන ශූරී (Ph.D) යන පශ්චාත් උපාධි පාඨමාලාවල ආදායම පිළිවෙලින් අවුරුදු 1, අවුරුදු 2, අවුරුදු 2, අවුරුදු 2 සහ අවුරුදු 3 කාලයන් තුළ ආදායම් ලැබෙන බවට හඳුනාගෙන ඇත.

2020 අධ්‍යයන වර්ෂයේ ක්‍රියාකාරකම් 2021.12.31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත. වෙනත් ආදායම් මූලාශ්‍ර (සටහන අංක 15) අදාළ මූල්‍ය වර්ෂයට අදාළව හඳුනාගෙන ඇත.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2011.12.28 දින පවත්වන ලද 71 වන රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව,' උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව දක්වා ලැබිය යුතු දේ තබා ගැනීමේ ක්‍රමවේදය උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති අවම කාල සීමාව දක්වා ලැබිය යුතු දේ පමණක් ගිණුමේ තබා ගැනීමේ තීරණය කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. අවම කාල සීමාවෙන් පසු නොගෙවූ සිසුන් ලැබිය යුතු ගිණුමෙන් ඉවත් කරනු ලැබේ. එම සිසුන් පසුව උපරිම කාල සීමාව තුළ ගෙවා ඇත්නම්, එම ලැබීම් එම වර්ෂයේ ආදායම ලෙස සලකයි.

2020 දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩලයෙන් අය විමට තිබෙන තත්‍ය ණය ශේෂය ලැබිය යුතු ණය වශයෙන් සලකනු ලැබේ.

4.3 **මුදල් හා මුදල් සමාන දෑ (Cash and cash equivalence)**

අතැති මුදල්,බැංකු තැන්පතුවල තිබෙන මුදල් , කල් පිරෙන තුරු බැංකු ගතව ඇති කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගෙන එනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී මුදල් හා මුදල් හා සමාන දෑ යන්නට අතැති මුදල් , බැංකු තැන්පතු , ශුද්ධ හිඟ බැංකු අයිරා ඇතුළත් වේ.

5. **වගකීම් හා ප්‍රතිපාදන**

මූල්‍ය තත්ව ප්‍රකාශනයක ජංගම වගකීම් ලෙස දක්වා ඇති වගකීම් වන්නේ කල් පිරීමෙන් පසු ඉල්ලූ විටක ගෙවන හෝ ශේෂපත්‍රය සකස් කරනු ලබන දින සිට වර්ෂයක් ඇතුළත ඉල්ලු විටක ගෙවිය යුතු ගෙවීම්ය. එසේම, ශේෂ පත්‍රය සකස් කරනු ලබන දිනයේ සිට වර්ෂයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන ශේෂයන් ජංගම නොවන වගකීම් යනුවෙන් හඳුන්වනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී උපචිත සියලුම වගකීම් ඒ සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

5.1 සේවක ප්‍රතිලාභ

5.1.1 නිත්‍ය දායකත්ව සැලසුම්

යම් පුද්ගලයෙකු සේවයෙන් විශ්‍රාම ගිය පසු ඔහු වෙනුවෙන් ආයතනය විසින් වෙන්ව ක්‍රියාකර ආයතනයක්ම ගෙවනු ලබන පසු රැකියා ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලසුමක් ලෙස හැඳින්වේ. මෙසේ ගෙවීම් කිරීමේ දී වැටුපෙන් ස්ථාවර අනුපාතයක් ගෙවනු මිස එය අභිබවා කිසිදු ගෙවීමක් කිරීමට නීතිමය බැඳීමක් නොමැත. සියලුම සේවා නියුක්තිකයින් ආවරණය වන පරිදි සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට ගෙවීම් සිදු කිරීමට ඇති බැඳීම් ලාභ ඉපයීමේ හෝ දරණ ලද පාඩු වල වියදමක් ලෙස ගැනේ.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සිය සේවානියුක්තිකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දළ වැටුපෙන් පිළිවෙලින් 15%ක් 3% ගෙවනු ලැබේ.

5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු සේවා නියුක්තිකයින් විශ්‍රාම ගැනීමෙන් පසුව ඔවුනට ප්‍රතිලාභ ලබා දීම සඳහාවන නිත්‍ය දායකත්ව සැළසුම්වලට අමතරව එයට අමතරව ප්‍රතිලාභ ලබාදෙන සැලස්මකි. සියලුම සේවා නියුක්තකයින් සඳහා සේවයට ඇතුළත් වූ පළමු වසරේ සිටම විශ්‍රාම පාරිතෝෂිත ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව යම් සේවා නියුක්තිකයෙකු හට එකී ගෙවීම් කිරීමට හැකියාව ඇත්තේ ඔහු හෝ ඇය වසර 05 ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

5.2 ප්‍රතිපාදන

අතීතයේ ඉටු කරන ලද කාර්යයක ප්‍රතිපලයක් ලෙස ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ නම් මෙම ප්‍රතිපාදන යථාවත් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය නීතිමය හා ගිවිසුම් ගත බැඳීම් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉදිරිපත් කොට ඇත. මෙම බැඳීම් සඳහා අදාළ ගෙවීම් කිරීමට ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය වන්නේය.

පාඨමාලා හැරයාම වෙනුවෙන් ප්‍රතිපාදන

සෑම උපාධි වැඩසටහනක් සඳහමෙ අයවැය සකස්කිරීමේ දී අපේක්ෂිත පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි ගාස්තු වලින් 10% ක ප්‍රමාණයක් අධ්‍යයන කටයුතු අතරමඟදී හැර යන සිසුන් වෙනුවෙන් වෙන්කරනු ලැබේ.

නමුත් පාඨමාලා අතරමඟදී පාඨමාලා හැර යන සිසුන් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොමැති අතරපාඨමාලා හැර යන සිසුන්ගේ තත්‍ය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ගැළපම් කරඇත.

5.3 වෙළෙඳ හා ගෙවිය යුතු වෙනත් දෑ

ගෙවීමට අපේක්ෂිත මුදල් හා මුදල් සමාන දෑ වගකීම් වශයෙන් ගිණුම් ගත කොට ඇත.

6. වෙනත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් මත වන ප්‍රාග්ධන වියදම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් වෙනත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම්මත වන වියදම් පුනරාවර්තන වියදම් ලෙසින් වාර්තාකර ඇත.

7. අසම්භාව්‍ය වගකීම් හා වත්කම්

7.1 **අසම්භාව්‍ය වගකීම්**

2021.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වගකීම් හඳුනා ගෙන නොතිබුණි.

7.2 **අසම්භාව්‍ය වත්කම්**

2021.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වත්කම් හඳුනා ගෙන නොතිබුණි.

8. **මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය**

8.1 වර්ෂයේ අතිරික්තය ගණනය කිරීමේ දී,ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හා මූලධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩු කරන ලදී.

8.2 ආයතනයේ ඉපැයීම් ධාරිතාව ඉහළ නැංවීම පිණිස සිය කටයුතු පවත්වාගෙන යෑමේ දී වත්කම් අත්පත් කර ගැනීම, වැඩි කර ගැනීම හා වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් මූලධන වියදම් ලෙසසලකන ලදී.

9. **බදුකරණය**

2006 අංක 01 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) (V) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කොට ඇත.

10. **රජයේ ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන අදාළ පිරිවැය හඳුනා ගන්නා ලද කාල පරිච්ඡේදය තුළ දී ලද ආදායම ලෙස සැලකේ.

මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද , නිදහස් කරන ලද හා නිදහස් කිරීමට ඇති මූල්‍ය ප්‍රතිපාදන ශේෂ පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

විස්තරය	2022 වෙන් කරන ලද මුදල (රුපියල්)	2022 නිදහස් කරන ලද ප්‍රතිපාදන (රුපියල්)	නිදහස් කිරීමට ඇති මුදල (රුපියල්)
පුනරාවර්තන ප්‍රතිපාදන	64,000,000	52,411,000	11,589,000
ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් 1. ගොඩනැගිලි 2. වාහන 3. උපකරණ 4.වෙනත්			
වත්කම් අත්පත් කර ගැනීම 1. පොත් හා වාර සඟරා 2.විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ 3. කාර්යාලයීය උපකරණ 4. ගෘහ භාණ්ඩ හා සවි කිරීම් 5. පරිගණක හා මෘදුකාංග 6. ක්‍රීඩා භාණ්ඩ			
එකතුව	**64,000,000**	**52,411,000**	**11,589,000**

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2022 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2022.12.31		2021.12.31	
වත්කම්		රු.	රු.	රු.	රු.
ජංගම වත්කම්					
(අ) මුදල්, මුදල් හා සමාන දෑ	01	18,690,464		7,316,429	
(ආ) වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ	02	84,229,282		15,222,428	
(ඇ) තොගය	03a	3,764,162		2,337,122	
නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන	03b	942,587		974,073	
(ඈ) පූර්ව ගෙවීම්	04	58,122		68,168	
(ඉ) ණය සහ අත්තිකාරම්	05.1	1,550,684		1,377,450	
(ඊ) කෙටි කාලීන ආයෝජන	06.1	658,695,737		656,532,568	
(උ) අනෙකුත් මූල්‍ය වත්කම්		192,800	**768,123,836**	192,800	**684,021,038**
ජංගම නොවන වත්කම්					
(අ) සේවක ණය සහ අත්තිකාරම්	05.1	3,707,525		3,115,507	
(ආ) දීගු කාලීන ආයෝජන	06	17,219,438		16,375,725	
(ඇ) දේපල පිරියත හා උපකරණ	07	167,616,627		122,131,541	
(ඈ) නොනිමි වැඩ	07a	2,197,146	**190,740,736**	2,197,146	**143,819,919**
මුළු වත්කම්			**958,864,573**		**827,840,957**
වගකීම්					
ජංගම වගකීම්					
(අ) විලම්බිත ආදායම්	08.1	5,838,166		15,498,690	
(ආ) ගෙවිය යුතු වියදම්	09	16,077,230		11,230,710	
(ඇ) උපචිත වියදම්/ වෙන්කිරීම්	10	62,587,126	**84,502,523**	37,381,918	**64,111,318**
ජංගම නොවන වගකීම්					
(අ) විලම්බිත ආදායම්	08.1	505,434		1,392,292	
306	වැඩමුලු සහ ව්‍යාපෘති වලින් ආයතනයේ දායකත්වය		469,660.56
307	නැතිවූ පුස්තකාල පොත් ගිණුම		-
308	කොළඹ ශාඛාවේ ආදායම් ගිණුම		23,043,050.00
309	ක්ෂයකිරීම් ගොඩනැගිලි	6,055,484.00	
310	ක්ෂයකිරීම්- කාර්යාලීය උපකරණ	1,110,468.95	
311	ක්ෂයකිරීම්- පුස්තකාල පොත්	327,108.79	
312	ක්ෂයකිරීම් - ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	959,378.51	
313	ක්ෂයකිරීම් - පර්යේෂනාගාර සහ ඉගෙනුම් උපකරණ	2,510,587.18	
314	ක්ෂයකිරීම් - උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය	360,057.55	
315	ක්ෂයකිරීම් - මෝටර් රථ	3,020,000.00	
316	ක්ෂයකිරීම්- දුරකතන පද්ධති	56,000.00	
317	ක්ෂයකිරීම් - පරිගණක හා මෘදුකාංග	7,865,333.14	
318	රඳවාගත් ඉපයුම් ගිණුම		(8,230,505.00)
319	ක්ෂයකිරීම් - ක්‍රීඩා උපකරණ	196,112.50	
	එකතුව	**1,234,009,112.45**	**1,234,009,112.45**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவல்கம்
NATIONAL AUDIT OFFICE

Postgraduate Institute of Agriculture
University of Peradeniya
24 MAY 2023
Financial Administration Branch

මගේ අංකය
எனது இல.
My No. සිපිසිජී/කේඩි/ඩී/පිජීඅයිඒ/2023/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 22 දින

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
04. උපකුලපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිපිසිජී/කේඩී/ඩී/පිජීඅයිඒ/2023/

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 මැයි 31 දින

අධ්‍යක්ෂ

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරවිකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය	ආයතනයේ ඇති අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් ඇමතිවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.5,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	

i. 2.3 ඡේදය

වසර 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022-2026 වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම එම ආයතනවලට ඉදිරිපත් කර නොතිබුණි.

ii. 4.2 ඡේදය

මුදල් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත ආයතනයේ විගණන වාර්තාව සමඟ ඉකුත් වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඇ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය

පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් හා අන්තර් හෝ අවසන් පර්යේෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව 2015 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී නිළධාරීන් 08 දෙනෙකු වෙත රු.8,819,379 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

(ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

i. 4.5 ඡේදය

(a) ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව පවත්වනු ලබන පාඨමාලාවන් අවසානයේදී ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසය තුළ ක්‍රියාත්මක කරන ලද පාඨමාලා 35 කින් ඉපයූ රු.318,338,875 ක ආදායම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණු පශ්චාත් උපාධි පාඨමාලා 60 ක අයවැය ලේඛනද පිළියෙල කර නොතිබුණි

ii. 5.2.1 ඡේදය

ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු වක්‍ර පිරිවැයෙන් සියයට 15 සිට සියයට 30 දක්වා ප්‍රමාණයක් ආයතනයේ පොදු කාර්යය පිරිවැය සඳහා වෙන් කළ යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2022

වර්ෂය දක්වා පිළියෙල කරන ලද අයවැය ලේඛන 16 ක ඇතුළත් රු.125,294,096 ක් වූ අයවැය ගත ආදායමින් පොදු කාර්යය පිරිවැය සඳහා අදාළ වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2017 වර්ෂයේ දී රු.2,100,000 කට ගිවිසුම් ගත වී එම වර්ෂයේදීම අත්තිකාරම් වශයෙන් රු.1,050,000 ක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 05 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

(ආ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත අවශ්‍ය උපකරණ ප්‍රමාණවත් ලෙස තිබියදී, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වටිනාකම රු.20,573,206 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මිලදී ගෙන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත ලබාදී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලද පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා 39ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි කර නොතිබුණි.

(ඈ) පර්යේෂණ කටයුතු වෙනුවෙන් 2018 ජනවාරි 30 දින ලැබී තිබුණු රු. 354,201 ක් වසර 03 ක කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) International Development Research Centre (IDRC) වෙතින් හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ප්‍රදාන යටතේ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු රු. 1,614,830 ක් වසර 02 සිට වසර 03 ක කාලයක් සිට උපයෝජනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිළධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිළධාරීන් 22 දෙනෙකු වසර 05 සිට වසර 34 දක්වා කාලයක් එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර.

1.2	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 43 හා 90 ඡේදවලට අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කිරීම තක්සේරු වෘත්තීයේ සාමාජිකයෙකු විසින් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනයට ප්‍රත්‍යාගණනය කරන ලද රු.56,297,200.00 ක ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සුදුසුකම් ලත් වෘත්තීය සාමාජිකයෙකු විසින් ඉටු කර නොතිබුනි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 43 හා 90 ඡේදවලට අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු විසින් කළ යුතු වුවද තක්සේරු දෙපාර්තමේන්තුවේ සීමිත කාර්යය මණ්ඩලයේ සේවා සැපයීමේ අසිරුව මත නියමිත දිනට ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කිරීමේ අපහසුව මත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛයට (ඇමුණුම අංක 1) ට අනුකූලව ඉඩම් ගොඩනැගිලි හා මෝටර් වාහන යන ස්ථාවර වත්කම් හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය පාලන අධිකාරිය මඟින් අනුමත කරන ලද කමිටුවක් මඟින් කළ හැකිය.ඊට අනුකලව මෝටර් රථ ප්‍රත්‍යාගණනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් වෘත්තීය තක්සේරුකරුවකුගෙන් සහ අනෙකුත් ස්ථාවර වත්කම් තක්සේරුකරණය පාලන අධිකාරිය විසින් අනුමත කරන ලද සුදුසුකම් සහිත කණ්ඩායමක් මඟින් ඉටුකරගන්නා ලදි. මෙම කමිටුව සඳහා කළමණාකරණ මණ්ඩලයෙහි අනුමැතිය 2023 වර්ෂයේ නොවැම්බර් මස ලබාගන්නා ලදි.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 71 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට රු.13,098,167.00 ක් වූ පුස්තකාල තැන්පතු වටිනාකම ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනා ගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගැලපීම් කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	පුස්තකාල තැන්පතු ඉල්ලූ විටක ගෙවිය යුතු වන වගකීමකි. මෙහිදී ප්‍රයෝගික තත්ත්වය වනුයේ ශිෂ්‍යාන්ට පාඨමාලා හැදෑරීම සඳහා ලබා දී ඇති උපරිම හා අවමකාල පරාසය තුල ඕනෑම අවශ්ථාවකදී පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම, බැහැර යාම, අතහැර යාම, ඉහල දැමීම (Upgrade the Degree) පහල දැමීම (Downgrade the Degree) යන ඕනෑම කාරණාවක් ඉටු කර ගත හැකි වීම මත පුස්තකාල තැන්පතු ඉල්ලීම කවර අවස්ථාකදී කෙරේද යන්න නිශ්චිතවම නිර්ණය කළ නොහැකි වීමයි. ඒ අනුව වසර දෙකක පශ්චාත් උපාධිය වසරකින් නිම කල හොත් ජංගම නොවන වගකීම ජංගම වගකීම් සනයට වැටේ මෙය ඉතා සංකීර්ණ ක්‍රියා වලියකි ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරණ ප්‍රමිත 1 හි 70 වන ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගෙන පෙන්විය යුතු බව සඳහන් වුවද 74 වන

		ඡේදයෙන් ද්‍රවශීලතාවය අනුව ඉදිරිපත් කිරීමේ ඉඩ ප්‍රස්තාවත් 81 වන ඡේදයේ අස්ථිත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය පැහැදිලිව හඳුනා ගත නොහැකි විට එම කාල සීමාව මාස 12 ක් යැයි උපකල්පනය කර වගකීම වර්ගීකරණය කල හැකි බව සඳහන්ය. ඒ අනුව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගැනීම නිවැරදිව, පැහැදිලිව කළ නොහැකි වන පුස්තකාල තැන්පතු ජංගම වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම නිවැරදිය
(ඇ)	අංක 09/2022 හා 2022 මැයි 05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2022 මැයි 10 දින සිට ක්‍රීඩා භාණ්ඩ හා විදුලි ජනන යන්ත්‍ර වෙනම වත්කම් පන්තීන් ලෙස හඳුනාගෙන පිළිවෙලින් සියයට 25 ක හා සියයට 10 ක ක්ෂය අනුපාතයන් යටතේ ක්ෂය කළ යුතු බව දක්වා තිබුණ නමුත් ආයතනය විසින් එම චක්‍රලේඛයට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් ගණනය කිරීමේදි ක්‍රීඩා භාණ්ඩ රු.14,023.00 ක් වැඩියෙන්ද, විදුලි ජනන යන්ත්‍ර රු.53,864.00 ක් අඩුවෙන්ද ක්ෂය කර තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	වත්කම් ප්‍රත්‍යාගණන කමිටුව නම් කිරීම, අනුමත කිරීම, ලේඛන පිළියෙල කිරීම ආදි මූලික ප්‍රතිපාදනයන්ගෙන් පසුව 2022 වර්ෂයේ නොවැම්බර් මස වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන ලදි. මෙහිදි වත්කම් වල අගයන් 01.01.2022 දිනට අදාල වන සේ එදිනට පැවති වෙළඳපල අගය මත පදනම් වූ සාක්ෂි පෙරදැරිව සාධාරණ වටිනාකමක් ලබාදෙන ලදි. මෙහිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 42 වැනි වගන්තියට අනුකූලව දේපළ, පිරියත හා උපකරණ අයිතමයේ ප්‍රකාශිත අගයට එනම් ප්‍රත්‍යාගණනය අදාල වන දිනට එහි සාධාරණ වටිනාකමින් පසුකාලීන සමුච්චිත කෂයවීම හා පසුකාලීන සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ අගයට ධාරණය කළ යුතුය.ඊට අනුකූලව වෙමින් ක්‍රීඩා භාණ්ඩ සඳහා වූ 5% ක කෂය වීම් වෙනස 2022.01.01 ප්‍රත්‍යාගණිත අගය තුලට එකතු කිරීමක් විදුලි ජනන යන්ත්‍ර සඳහා වූ 10% ක කෂය වීම් වෙනස ප්‍රත්‍යාගණිත අගය තුල අඩුකිරීමක් කර ප්‍රමිතියේ 76 වැනි වගන්තියට අනුගත වෙමින් සරල මාර්ග ක්‍රමය අනුව වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා එක සමාන කෂය ප්‍රමාණයන් අය කිරීමේ පදනමින් නව ප්‍රතිශතය මත කෂය වීම් ගණනය කළෙමු.
(ඈ)	මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේපල පිරියත හා උපකරණ වල පිරිවැය රු.267,425,172.00 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව එය රු.98,066,234.00 ක් වූයෙන් රු.169,358,937.00 ක නොසැසඳීමක් නිරීක්ෂය විය. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	ගොඩනැගිලි, පුස්තකාල පොත් හා සඟරා, භූමි සැකසුම් ව්‍යාපෘතිය යන ස්ථාවර වත්කම් හැර කාර්යාල උපකරණ, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ, ලී බඩු හා සවිකිරීම්, පරිගනක හා මුද්‍රණාංග, දුරකථන හා මොටර් රථ යන ස්ථාවර වත්කම් වල එක් එක් අයිතමය වෙනුවෙන් මිලදිගත් දින, භාණ්ඩ ඇණවුම් අංක දින, බිල්පත් අංක දින, ගැණුම් කරු හා අදාල විස්තර, භාණ්ඩ වල ස්වභාවය අනිකුත් සියලු විස්තර ඇතුලත් විස්තරාත්මක පරිගණක ලේඛණයක් පවත්වාගෙන යනු ලබන අතර එමඟින් අත්‍යවශ්‍ය තොරතුරු පමණක් ඇතුලත් වාර්ෂිකව

		ස්ථාවර වත්කම් ලේඛණය මුද්‍රණය කර පොතක් ලෙස විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබයි. එහි රු. 98,066,234 වටිනාකම් සහිත වත්කම් ඇතුලත්ව ඇත. රු.169,358,937 ක් පිරිවැය වූ ගොඩනැගිලි, පුස්තකාල පොත් හා සගරා, භූමි සැකසුම් ව්‍යාපෘතිය යන ස්ථාවර වත්කම් වල ඉහත සඳහන් කල එක් එක් අයිතමය සඳහා විශාල තොරතුරු ප්‍රමාණයකින් සමන්විත නොවන හෙයින් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුලත් වෙනම ලේඛණයක් විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබයි. මෙයට අමතරව වාර්ෂික ක්ෂය සම්බන්ද ජ'නලය සමග සියලුම ස්ථාවර වත්කම් වල වාර්ෂික ක්ෂය ගණනය කර වාර්ථාවක්ද ඉදිරිපත් කර ඇත.
1.3	**නීති රීති / විධානයට යොමුව**	
	1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක PED /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 8.2.2. ඡේදය ආයතනයේ ඇති අතිරික්ත මුදල්, ස්ථාවර තැන්පතු,භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හා වෙනත් කෙටිකාලීන ආයෝජනයන් සඳහා යෙදවීමේදී මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව රු.5,000,000.00 මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක PED /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.2.2 ඡේදයට අනුකූලව 2022 වර්ෂයේ දෙසැම්බර් 30 ට පවතින අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීම පිණිස සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මුදල් අමත්‍යාංශයේ ලේකම් වෙත 2022.10.20 දිනැති ලිපිය ඉදිරිපත් කළෙමු.මේ සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමණාකරණ මණ්ඩල නිර්දේශය 2022.07.24 දිනැති පැවති 262 වැනි රැස්වීමේදි ලබා ගන්නා ලදි. අනතුරුව 2022.11.09 දාතමින් යුතු ලිපිය මඟින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන ගණකාධිකාරිවරයා විසින් ආයෝජන අනුමැතිය ලබාගැනීම සඳහා පනතේ ප්‍රතිපාදන සහිත ආකෘති පත්‍රයට අනුකූලව තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටි අතර 2022.11.11 දින එය සම්පූර්ණ කර යළිත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළෙමු.(ඇමුණුම අංක 2) ඉන් අනතුරුව දෙසැම්බර් 30 වන තුරුත් අනුමැතිය නොලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍ර ලේඛ

.			අංක 02/2019 හා 04/2011 යන චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවීමේ පටිපාටිය යටතේ ස්ථාවර තැන්පතු අනුපාතයන් කැඳවා ඉහළම පොලී අනුපාතයක් ඉදිරිපත් කළ මහජන බැංකුවෙහි රු 5,000,000 ක ස්ථාවර තැන්පතුවක් මාස 03 කාලයකට තැන්පත් කරන ලදී. මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා මාස 03 කට වැඩි කාලයක් ගත වන නිසාත් මිල ප්‍රකාශනයක වලංගු කාලය දින 03 ක් පමණක් වන නිසාත් අනුමැතිය ලබාගැනීමෙන් පසු ආයෝජන කටයුතු වල නියැලීමේදී වර්ෂ අවසාන අතිරික්තය නියමිත දිනට ආයෝජනය කිරීමේ ප්‍රායෝගික දුෂකරතාවලට මුහුණ පෑමට සිදුවන බැවින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබෙන තුරු ආයතනයේ පාලක මණ්ඩල අනුමැතින් සහිතව ආයෝජනය කළෙමු
(ආ)	2003 ජුනී 02 දිනැති PED /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය		
i.	5.1.3.ඡේදය	වසර 03 කට නො අඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති,භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්,2022 -2026 වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම එම ආයතනවලට ඉදිරිපත් කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	මෙවර සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ අනුගත වෙමින් එය සිදු කිරීමට ආයතනය කට යුතු කරන ලද අතර ඒ සඳහා සකච්ඡා වට කිහිපයක් ද පවත්වන ලදි. ඒ අනුව පිළියෙල කරන ලද සංයුක්ත සැලස්ම ආයතනයේ කළමණාකරණ මණ්ඩල අනුමැතිය සහිතව 08.04.2022 දින අදාළ රේඛීය ආයතන වලට යොමුකිරීමට කටයුතු කරන ලදි. (ඇමුණුම අංක 3)
ii.	6.5.3 ඡේදය	මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත ආයතනයේ විගණන වාර්තාව සමඟ ඉකුත් වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා දිනයක් ලබා ගැනීමට එය 2022.08.18 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශ වෙත යොමු කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය 2022.09.16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කල බව ආයතනය වෙත දැනුම් දුන් අතර එසේම අමාත්‍යාංශය විසින් දන්වා එවන ලද දිනය වන 27.03.2023 දින වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ආයතනය කටයුතු කරන ලදි. (ඇමුණුම අංක 4)

	(යොමුව - CPCG/KD/D/PGIA/2023/06)		
(ඇ)	අංක 02/2014 හා 2014 පෙබරවාරි 11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ	පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් තොරව හා කිසිදු අන්තර් පර්යේෂණ වාර්තාවක් හෝ අවසන් පර්යේෂණ වාර්තාවක් හෝ ලබා ගැනීමකින් තොරව නිළධාරීන් 08 දෙනෙකු සඳහා 2015 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව තුළ රු.8,819,379 ක පර්යේෂණ දිමනා ගෙවා තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	අංක 02/2014 හා 2014 පෙබරවාරි 11 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛය පරිදි නිලධාරීන් හට පර්යේෂණ දීමනා ගෙවීමේදි ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පර්යේෂණ කළමණාකරණ කමිටුවක අනුමැතිය ලබාගත යුතු බැව් දක්වා ඇත.මීට අනුකූලව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ දීමනා හිමි සියළුම නිලධාරීන් අනධ්‍යන අංශයේ නියෝජ්‍ය ලේඛාකාධිකාරි හරහා උපකුලපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කරන්නෙමු. අධ්‍යක්ෂ තුමා හා සහකාර පුස්තකාලයාධිපති අධ්‍යයන ආයතන අංශයේ ලේඛකාධිකාරි හරහා උප කුලපති තුමාගේ අනුමැතියට ඉදිරිපත් කෙරේ. චක්‍ර ලේඛය ඉදිරිපත් කරන ලද මුල් වර්ෂවලදි විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කළමණාකරණ කමිටුවක් පැවති අතර ඔවුන්ගේ නිර්දේශ මත උපකුලපතිතුමාගේ අනුමැතිය මත ගෙවීම් කරන ලදි. නමුත් එම කමිටුව පසු කාලෙක ක්‍රියාකාරි නොවුවද 2022 වර්ෂයේ පටන් යළිත් ක්‍රියාකාරිව එම පර්යේෂණයන්ට අදාළ විෂය පිළිබඳ ප්‍රවීණ ආචාර්යවරුන් වෙත යොමු කරමින් පර්යේෂණ යෝජනාවන් ඇගයීමට ලක් කර එක් කළ යුතු නව්‍යතාවයන් පෙන්වා දෙමින් නිවැරදි කරන ලද පර්යේෂණ යෝජනාවන්ට අනුමැතිය ලබාදේ. දැනට පවතින නිර්දේශයන්ට අනුව අන්තර් පර්යේෂණ වර්තා සහ අවසන් වාර්තා කැඳවීමක් කරනු ලැබේ.පර්යේෂණ දීමනා මෙතෙක් ලද නිලධාරීන් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා වල අන්තර් හා අවසන් වාර්තාද සකස් කර ඇති අතර ඉදිරිපත් කිරීමට නිර්දේශයන් ලද හොත් ඉදිරිපත් කරනු ඇත.පර්යේෂණ යෝජනා පිළිබඳ සියළුම වාර්තා අධ්‍යයන හා අනධ්‍යයන අංශ සතුව පවති. ගෙවීම් නිර්දේශ ලිපිය පමණක් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගීණුම් අංශය වෙත ලබා දේ. (ඇමුණුම අංක 05)

(ඉ)	2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	
i.	4.5 ඡේදය (අ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණු පශ්චාත් උපාධි පාඨමාලා 60 ක අයවැය ලේඛන පිළියෙල කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/37(1))	අප ආයතනය විසින් උපාධි පාඨමාලාවන් 60ක් ඉදිරිපත් කලද එම උපාධි පාඨමාලා 60 ක්‍රියාත්මක කරනුයේ අධ්‍යයන මණ්ඩල 11ක් යටතේය. අයවැය ලේඛනයන් පිළියෙල කිරීමේදී අධ්‍යයන මණ්ඩල වශයෙන් ඉහත උපාධි පාඨමාලා සියල්ල ආවරණය වන පරිදි පිළියෙල කරනු ලැබේ.මෙලෙස අයවැය ලේඛන 11 ක් පිළියෙල කර කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත
	(ආ) ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව පාඨමාලාවන් අවසන් කළ යුතු අවම කාල සීමාව අවසානයේදී ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්,2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම රු.318,338,875.00 ක පාඨමාලා 35 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/37(1))	මෙහිදී ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලාවන්හී පාඨමාලා කටයුතු අවම කාල සීමාව තුලදී අවසන් වීම ප්‍රායෝගිකව සිදු නොවේ. සිසුන්ගේ අභිමතය පරිදි සිය පාඨමාලාව අවසන් කිරීම සිදුවන බැවින් මෙම වියදම් අවම කාල සීමාව ඉක්මවා උපරිම කාල සීමාවද ඉක්මවන අවස්ථා බහුලය. නමුත් එක් එක් වැය ශීර්ෂයන් යටතේ හදුනා ගන්නා වියදම් වාර්තා වෙන වෙනම පවත්වාගෙන යමින් එහි සීමාව ඉක්මවා යන්නේදැයි පරීක්ෂා කරනු ලබයි. නමුත් මෙම වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලට අදාළ වියදම් අනෙකුත් කෙටි පාඨමාලාවල (Workshop, Short Course etc.) මෙන් කෙටි කලක් තුල හදුනා ගත නොහැක උදාහරණ ලෙස, • දේශකවරුන්ගේ දේශන ගාස්තු ඔවුන් උගන්වා වර්ෂ ගණනක් යනතුරු ඉල්ලුම් නොකිරීම. • ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියා පදිංචි වනතුරු සමහර ප්‍රායෝගික විෂයන් වසර කීපයක් ඉදිරිපත් නොකිරීම. (Field Visit, Outbound Training Programme) මේ යටතේ පසුගිය කෝවිඩ් 19 වසංගතය කාල සීමාව තුල පැවැත්වීමට තිබූ ක්ෂෙත්‍ර ගවේෂණ (Field

			Visit) විෂය 2019,2020,2022 යන අධ්‍යයන වර්ෂ සියල්ල එක් කරමින් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම. (2021 අධ්‍යයන වර්ෂය අතහැර දමන ලදි) • සිසුන් උපාධි පාඨමාලාව හදාරා අවසන් කර වර්ෂ ගණනක් යනතුරු නැවත ගෙවන තැන්පතු (Refundable Deposits) මුදල ඉල්ලුම් නොකිරීම. මෙම හේතූන් නිසා උපරිම කාල සීමාවද ඉක්මවා ඇති වුවද අදාල මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක්ව පවතී. නමුත් වර්ථමානය වනවිට 2016 හා 2017 අධ්‍යයන වර්ෂය වලට අදාල මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමට අවශ්‍ය මූලික තොරතුරු සකස් කරමින් පවතී
ii.	5.2.1 ඡේදය	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු වක්‍ර පිරිවැයෙන් සියයට 15 සිට සියයට 30 දක්වා ප්‍රමාණයක් ආයතනයේ පොදු කාර්යය පිරිවැය සඳහා වෙන් කළ යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පිළියෙල කරන ලද අයවැය ලේඛන 16 ක ඇතුළත් රු.125,294,096.00 ක අයවැය ගත වටිකාකමින් පොදු කාර්යය පිරිවැය සඳහා අදාළ වෙන් කිරීම් සිදු කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/37(1))	04/2016 චක්‍රලේඛයේ 5.3 වගන්තියට අනුව ආයතයේ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු සෑම ආයතනික වියදමක් සඳහාම එක් එක් අධ්‍යයන මණ්ඩලයන්හී ආදායමින් 20% අවමයකට හා 35% උපරිමයකට යටත් වූ ප්‍රතිශතයක් ලබාගනී. මෙම ප්‍රතිශතය තීරණය වනුයේ 5.1.5,5.2.1 හා 5.2.2 යන ශීර්ෂයන් සියල්ලගේම එකතුවෙනි. අප විසින් එක් එක් අධ්‍යයන මණ්ඩල වල ආදායම් අනුව (වැඩි ආදායම් ලබන අධ්‍යයන මණ්ඩල වලින් වැඩි ප්‍රතිශතයක් ලෙස) 5.1.5 ශීර්ෂය යටතේ අදාල ප්‍රතිශතය ලබා ගන්නා බැවින් නැවත 5.2.1 ඡේදය ප්‍රකාරව මුදල් වෙන් කිරීමක් නිශ්චිත ලෙසම සිදු කරනු නොලැබේ. එමෙන්ම අධ්‍යයන මණ්ඩල වෙනුවෙන් දරණු ලබන සුළු වියදම් ආයතනය විසින්ම දරා ගනු ලබන අවස්ථාද ඇත.

2.2.3	**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**	
(අ)	ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපික කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ රු.2,100,000.00 කට ගිවිසුම් ගත වී අත්තිකාරම් වශයෙන් රු.1,050,000.00 ක් ගෙවා තිබුණද, ගිවිසුම් ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 05 කට වැඩි කාලයක් ගත වී තිබුණද, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	ගිණුම් කරණ පද්ධතියේ අවසන් පරිශීලකයන් එය භාවිතයේදී මුහුණ දෙන ගැටළු සම්බන්ධව මේ වසර මුලදී නිෂ්පාදන සමාගම සමඟ පවත්වන සකච්ඡා වලින් අනතුරුව එම ගැටළු නිරාකරණය කිරීමේ කටයුතු මේ වන විට කරගෙන යන අතර ඉන් 60% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇත. එසේම අවසන් පරිශීලකයන් විසින් එම පද්ධතියේ නියදියක් තම දෛනික කටයුතු ගොනු කිරීම සඳහා භාවිතා කිරීමට කටයුතු කල අතර පද්ධතිය ස්ථිරව භාවිතයට ගැනීමේ හැකියාව පිළිබඳ තහවුරු කරගැනීමක් එමඟින් බලාපොරොත්තුවේ. එසේම මෙහි ප්‍රතිඵල නිෂ්පාදන සමාගම හා විගණන අංශය වෙත යොමු කෙරෙන අතර වසර අවසන් වීමට පෙර ගිණුම් කරණ අංශයේ දත්ත කළමණාකර කටයුතු සඳහා ගිණුම් කරණ පද්ධතිය එක් කරගැනීමට බලාපොරොත්තු වේ.
(ආ)	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත අවශ්‍ය උපකරණ විශ්වවිද්‍යාලය විසින් ලබා දී තිබියදීත්, මෙම ආයතනය විසින් රු.20,573,206.00 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මිලදී ගෙන කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත ලබාදී තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතුව විද්‍යාගාර පහසුකම් නොමැති නිසා පශ්චාත් උපාධි සිසුන්ගේ ප්‍රයෝගික පුහුණු හා පර්යේෂණ කටයුතු කරගෙන යැමේ ගැටළුවට විසඳුමක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යාපීඨයේ විද්‍යාගාර පහසුකම් ලබා ගැනීමට ආයතනයට සිදු වේ. ආයතනය සඳහා විද්‍යාගාරයක් ඉදිකිරීම මෙන්ම සුදුසුකම් ලත් නිලධාරීන් පත් කරගැනීම අධික පිරිවැයක් දැරීමට සිදුවන කාර්යයක් බැවින් පීඨයේ විද්‍යාගාර භවුලේ භාවිතා කිරීම වර්තමාන තත්ත්වය යටතේ වඩාත් යෝග්‍ය නිසා එම විද්‍යාගාර වල නොමැති පශ්චාත් උපාධි හා පර්යේෂණ හා ප්‍රායෝගික කටයුතු සඳහා අත්‍යවශ්‍ය විද්‍යා උපකරණ අධ්‍යයන මණ්ඩල වලින් කරන ඉල්ලීම් වලට අනුව එම අධ්‍යයන මණ්ඩල වෙත ලබාදීමට ක්‍රියාකල අතර ආයතනයේ මූලික අරමුණු අනුව කටයුතු කරමින් සිසුන් වෙත වඩාත් යෝග්‍ය ප්‍රයෝගික පුහුණුවක් හා පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා අවස්ථාවක් ලබා දීම මෙහි මූලික බලාපොරොත්තුව විය.

		තවද මෙසේ මිලදි ගත් උපකරණ තාවකාලිකව එම විද්‍යාගාර වල තබා ඇති අතර ඒවායේ අයිතිය ආයතනය සතුවේ. මෙසේ එම අධ්‍යයන මණ්ඩල වල තබා ඇති භාණ්ඩ පිළිබඳ වාර්ෂිකව තොග සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන අතර ආයතනය සඳහා විද්‍යාගාරයක් ඉදිකිරීමෙන් පසුව එම සියළුම උපකරණ එහි ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	අනුමත ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණු ර.14,150,000.00 ක ප්‍රසම්පාදනයන් 05 ක් ක්‍රියාත්මක නොකර අත හැර තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් මිලදි ගැනිම් සැලකිය යුතු ප්‍රමාණයක් එම වසර තුලදි සිදු කරන ලද අතර විගණන විමසුමේ දක්වා ඇති මිලදි ගැනීම් එම වසර අවසනදී සිදු කිරීමට නොහැකි වූවේ එම වසර මැදදි රජය විසින් රාජ්‍ය අංශ වල ප්‍රසම්පාදන කටයුතු වලට සිමා පැන වූ බැවිනි.
(ඇ)	2015 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලද පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා 25 ක් හා 2018 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ තවත් පාඨමාලා 15 ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	විගණන විමසුමෙන් දක්වා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම සිදු නොකෙරෙන අතර එය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව (MSc) සම්පූර්ණ නොකෙරෙන එහෙත් Credit 25 සම්පූරණ කරන සිසුන් සඳහා SLQF ක්‍රමවේදය අනුව පිරිනමන Early exit හා Fall back option අනුව පිරිනමන උපාධියකි. කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය කෘෂිවිද්‍යා සිසුන් වෙත පිරිනමන විද්‍යාපති පර්යේෂණ (MSc), දර්ශන ශූරී (MPhil), දර්ශන පති (PhD) යන සියළු පශ්චාත් උපාධි පාඨමාලාවන්ට ආදළ ප්‍රවර්ධන වැඩසටහන් ආයතනය විසින් නිරතුරව ක්‍රියාත්මක කෙරෙන අතර ඒ අනුව විද්‍යාපති පර්යේෂණ පාශ්චාත් උපාධි පාඨමාලාවට (MSc) ආදලව සිදු කරන ප්‍රවර්ධන කාර්යයේදි විගණන විමසුමේ දක්වා ඇති සියළු පාඨමාලාවන් ආවරණය වේ.නමුත් සමහර පාඨමාලා සඳහා කාලීනව ඉල්ලුමෙහි අඩු වැඩි වීම් පවතින අතර එම පාඨමාලා සඳහා සිසුන් අඩු ගණනක් ඉල්ලුම් කර විට එම පාඨමාලා ආර්ථික වශයෙන් පවත්වා ගත නොහැකි නිසා එම සිසුන් කීහිප දෙනා ඔවුන්ගේ අධ්‍යයණ මණ්ඩල ස්වභාවයට අනුව වෙනත් පාඨමාලා සඳහා ලියාපදිංචි කර ගැනිමට කටයුතු කරනු ලැබේ.

		එසේම සියළු පශ්චාත් උපාධි පාඨමාලවන් ප්‍රවර්ධනය කිරීමේ දී ආයතනයේ වෙබ් අඩවිය මුලිකව උපකාර කරගන්නා අතර, විෂය ක්ෂේත්‍රයට ආදළ වන සිසුන් වෙත විද්‍යුත් පණිවිඩ යැවීම, කෙටි පණිවිඩ යැවීම හා සමාජ ජාලා හා අදාලවන නවීන සන්නිවේදන මෙවලම් භාවිතා කිරීම සිදුවේ. එසේම සිසුන් දැනුවත් කිරීම සඳහා විශ්ව විද්‍යාල මට්ටමෙන් පවත් වන ප්‍රවර්ධන වැඩසටහන් වලට ආයතනය නිරතරුවම දායකත්වය දක්වමින් උපාධි පාඨමාලවන් ප්‍රවර්ධනය කිරීමට මූලිකව කටයුතු කරනු ලැබේ.මේ අනුව කටයුතු කල නිසා ආර්ථිකමය හා සමාජීය වශයෙන් ඉතා දුෂ්කර වසරක් වූ 2022 වසර තුලදි ආයතනයේ පශ්චාත් උපාධිය සඳහා සිසුන් 500 ඉක්මවා ලියාපදිංචි කර ගැනිමේ හැකියාව ලැබුනි
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට වසර 03 සිට වසර 06 දක්වා කාලයක් ඉක්මවා තිබුණු රු.28,608,077.00 ක දේශන ගාස්තු ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	විගණන විමසුමේ දක්වා ඇති 2015 සිට 2019 දක්වා වූ කාලයට අදාල නිරවුල් නොවූ දේශන ගාස්තුවල වටිනාකමෙන් අදාල අධ්‍යයන වර්ෂ දෙක අවසානයේ නොගෙවූ ප්‍රමාණය මුදල් රෙගුලාසි ප්‍රකාරව අදායම් ගිණුම්වලට ඒ ඒ වර්ෂවලදී ගෙන ඇත. එසේම එම ගෙවිය යුතු ප්‍රමාණයන්ට අදාලව ගෙවීම් සඳහා ඉදිරිපත්වූ අවස්ථාවලදී මූල්‍ය රෙගුලාසි අංක 115 අනුව මුදල් කමිටුව, කළමණාකරණ කමිටුව හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන 2022 වර්ෂයේදී ගෙවීම් කර ඇත. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් පහත වේ. **අධ්‍යයන වර්ෂය** — **ආදායමට ගත් වර්ෂය** — **අදායම් ලෙස ගත් මුදල** — **2022.12.31 දිනට ගෙවීමට ඇති ප්‍රමාණය** 2015 — 2017 — 3,933,813.00 — 3,346,822.38 2016 — 2018 — 6,785,100.00 — 6,017,437.68 2017 — 2019 — 6,440,075.00 — 4,303,010.67 2018 — 2020 — 10,162,950.00 — 5,761,613.67 2019 — 2021 — 13,698,310.00 — 9,176,193.00

(ඊ)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් පර්යේෂණ කටයුතු වෙනුවෙන් 2018 ජනවාරි 30 දින ලැබී තිබුණු රු.354,201.00 ක් වසර 03 ක කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	1978 වර්ෂයේ පටන්ම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨයට සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට මුදල් ප්‍රදානයක් කරනු ලබන්නේ භෝග විද්‍යා අධ්‍යයනාංශයේ (Crop Science) කෘෂිකර්මික අධ්‍යයන කටයුතු සහ කෙෂත්‍ර චාරිකා කටයුතු උදෙසාය.එය පර්යේෂණ ප්‍රදානයක් නොවේ. මෙහිදී අවසන් වරට මුදල් ප්‍රදානයක් ලැබී ඇත්තේ 2018 ජනවාරි මාසයේදීය.එය රු.250,000.00 කි. පෙර වර්ෂ වලින් ඉතිරි මුදල් ද සමඟ 2022.12.31 දිනට මෙහි රු.354,200.93 ක ශේෂයක් පවති. අවසන් වරට කෙෂත්‍ර චාරිකා වියදමක් ලෙස රු.23,860.00 මුදලක් 2019 වර්ෂයේදි දරා ඇති අතර ඉන් පසු පැවති කොරෝනා වසංගත තත්ත්වය මත පසුගිය වසර 3 ක කාලයක් පුරා කෙෂත්‍ර චාරිකා හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකරකම් වල යෙදීමක් සිදුනොවූ බැවින් වියදම් දැරීමට සිදු නොවිණි. නමුත් රට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමේදි කෘෂිකර්මික භෝග විද්‍යා අධ්‍යයනාංශයේ ඉදිරි අධ්‍යයන කටයුතු වලදි මෙම මුදල් උපයෝජනය කරනු ඇත.
(උ)	International Development Research Centre (I.D.R.C) ප්‍රදාන යටතේ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණ ර.1,260,629.00 ක් වසර 02 ක කාලයක් තිස්සේ උපයෝජනය කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) මඟින් අඛණ්ඩවම විවිධ පර්යෙෂණ ව්‍යාපෘතින් උදෙසා කෘෂිකාර්මික ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය වෙත ප්‍රදානයන් ලබාදෙයි. මේ වන විට IDRC පර්යේෂණ ව්‍යාපෘතින් තුනක පර්යේෂණ කෙරිගෙන යනු ලබයි. මෙහිදි පශ්චාත් උපාධිය හදාරණ කෘෂිකාර්මික ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලයේ සිසුන් කිහිප දෙනෙකු, උදෙසා පාඨමාලා ගාස්තු හා අදාල සියළුම ගෙවීම්, රු.37,000.00 ක මාසික දීමනා හා සියළුම පර්යේෂණ වියදම් දැරීමක් සිදුවේ. මේ වන විට මෙම පර්යේෂණයට අදාළ සිසුන් පර්යේෂණයන් අවසන් කර හා අවසාන අදිරයෙහි සිටී. ඒ අනුව 2023 වර්ෂයේදි සියළුම වියදම් පියවා දමා IDRC පළමු පර්යේෂණ කටයුතු නිමා කිරීමේ හැකියාවක් පවතියි. මෙම පර්යේෂණ අරමුදලෙන් 2020 වර්ෂයේදි රු.53,824.00 ක්ද 2022 වර්ෂයේදි රු. 22,026.00 ක්ද වශයෙන් පර්යේෂණ වියදම් දරා ඇත.

(ඌ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගබඩාවේ පැවති රු. 208,693.00 ක අතිරික්ත තොගයක් තොග පොතට ඇතුළත් කර නොතිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	2022.12.31 දිනට පැවති තොග සමීක්ෂණ වාර්තාවට අනුව තොග පොත් වලට එතෙක් ඇතුලත් කර නොතිබූ රු.208,693.00 භාණ්ඩ, තොග පොතෙහි ඇතුලත් කොට නිවැරදිව අවසන් තොගය ගණනය කර අවසන් ගිණුම් පිළියෙල කරන ලදි. මෙම තොගය තුල වැඩි ඉල්ලුමක් නොමැති ඉතා පැරණි තොගද ඇතුලත් වේ.
(එ)	විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිළධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිළධාරීන් 22 දෙනෙකු වසර 05 සිට වසර 34 දක්වා කාලයක් එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් අනුබද්ධ ආයතනයන් වුවත් ආයතනයේ සේවය කරන කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරුවීම් සිදු කිරීමේදි පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ සෘජුවම සිදුකිරීමට නොහැකි අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා කිරීමට සිදුවීම ස්ථීර මාරු ප්‍රතිපත්තියක් සකස්කිරීමේ දි ආයතනය මුහුණ දෙන ප්‍රධාන ගැටළුව වේ. එසේම දැනටමත් ආයතනයේ අවශ්‍යතාවය මත හා විවිධ අංශවල කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ ක්‍රමවේදයක් ලෙස අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
(ඒ)	නිසි අවධානයකින් හා අධීක්ෂණයකින් තොරව ආයතනයේ පර්යේෂණ වියදම් මෙහෙයවීම හේතුවෙන් ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ලංකා බැංකුවේ අංක 0001273337 දරණ ජංගම ගිණුමේ සමාලෝචි වර්ෂයේ අවසාන දිනට ලැබුණු මුදල් ප්‍රමාණය ඉක්මවා රු.27,872.00 ක් වියදම් කර තිබුණි. (යොමුව - CPCG/KD/D/PGIA/2023/06)	පර්යේෂණ කටයුතු වෙනුවෙන් ගෙවීම් කටයුතු කරනු ලබන ලංකා බැංකුවේ අංක 0001273337 දරණ ගිණුමෙහි 2022 දෙසැම්බර් මස ගෙවීම් කටයුතු කිරීමේදි මුදල් පොතේ පමණක් වැඩිපුර ගෙවීමක් කර ඇත. එය බැංකුවේ අයිරාවක් ඇති වී නොමැත. ඒ.පී.එන් ව්‍යාපෘතිය,කැප්නෙට් ව්‍යාපෘතිය, අයි.ඩී.අර්.සී ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වල ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ආයතනයේ වාහන භාවිතා කිරීම මත අයතනය වෙත ගෙවිය යුතු ප්‍රමාණය වෙනුවෙන් කල ගෙවීම් කිරීම හේතුවෙන් මෙම වැඩිපුර චෙක් පත් ලිවීම සිදුව ඇත. වර්ෂයේ අවසන් ගිණුම් කටයුතු වෙනුවෙන් මෙම නිරවුල් නිරීම අත්‍යවශ්‍ය (මුදල් ගෙවීම හා ආදායම් ලැබීම) වන බැවින් අදාල චෙක්පත් ලියා බැංකුවට ඉදිරිපත් නොකර සිටීමට කටයුතු කර ඇත. එම චෙක්පත් 2023 ජනවාරි මස බැංකුවට ඉදිරිපත් කර ඇත. මේ අනුව බැංකු ගිණුමෙ අයිරාවක් පැන නොනැගුණි.

(ඒ)	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛණය 2022 නොවැම්බර් 25 දින සංශෝධනය කර තිබියදීත් ශීර්ෂ 24 ක අයවැය ගත ආදායම / සත්‍ය ආදායම් හා අයවැය ගත වියදම් / සත්‍ය වියදම් අතර සියයට 32 සිට සියයට 209 දක්වා විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂනය විය. (යොමුව - CPCG/KD/D/PGIA/2022/60)	සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කරනු ලැබුවේ මහ භාණ්ඩාගාරයේන් අනුමැතිය ලද මුදල හා උපයාගත හැකි යැයි උපකල්පනය කරන ලද අරමුදල ආදායම් ලෙස සලකමිනි. නමුත් රටෙහි පැවති දැඩි ආර්ථික අර්බුදය හමුවේ අනුමැතිය ලද පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන ද කපා හරින ලද අතර, ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් නොලදිමු. මේ අනුව අය පාර්ශවය තව දුරටත් සංශෝධනය විය යුතු විය. එමෙන්ම 2021 දෙසැම්බර් මස සහ 2022 වර්ෂයේ මුල් මාස තුලදී ඇණවුම් කරන ලද එහෙත් නොවැම්බර් මස වන තුරුත් කිසිදු ප්‍රතිචාරයක් නොලද මිල අධික උපකරණ යන්ත්‍ර සූත්‍ර 2022 දෙසැම්බර් මස වන විට රටේ පැවති ඩොලර් අර්බුදය යම් තරමකින් සහනදායි වෙද්දී අප ආයතනය වෙත සැපයීමට සැපයුම් කරුවන් ක්‍රියා කරන ලදි. එමෙන්ම බොහෝ පුනරාවර්තන වියදම්ද දෙසැම්බර් මස දී අනපේක්ෂිතව දැරීමට සිදු විණි. මේ අනුව වැය ශීර්ෂ ද සංශෝධනයෙන් පසුවත් වෙනස් විය. රට තුල පැවති අසාමාන්‍ය ආර්ථික අර්බුද, ඩොලර් ප්‍රශ්නය, අධික උද්දමනය සහ බදු පැන වීම මත අය වැය ලේඛනය පල දායි පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට මෙවර අපට හැකියාවක් නොලැබුණි. **අයවැය පාලනය** අයවැය විචල්‍යතාවයන්ට හේතු පහත සඳහන් පරිදි පැහැදිලි කළ හැකිය **ආයොජන ආදායම්** - 2022 වර්ෂයේදී ස්ථාවර තැන්පතු කල්පිරීමේදී ඉහළ ස්ථාවර තැන්පතු පොලී අනුපාත යටතේ නැවත ආයෝජනය කිරීම හේතුවෙන් ආයෝජනවල පොලී ඉක්මවා ඇත. වසරේ දෙවන භාගය තුළ ස්ථාවර තැන්පතු පොලී අනුපාතවල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. දේපල කුලියට දීම - 2022 අධ්‍යයන වර්ෂය අවසාන කර්තුවේදි රටේ ආර්ථික තත්වය යහපත් වීම මත සංචාරක බංගලාවේ ආදයම් වැඩිවීම මත මෙම ආදායම වැඩි විණි

		සමාසික ගාස්තු - 2021 අධ්‍යයන වර්ෂය ඉවත් වීම මත එම වර්ෂයේ එක්වූ සිසුන් සමග 2022 වර්ෂයේ ලියාපදිංචි සිසුන් ප්‍රමාණය සැලකිය යුතුව වැඩි වූ බැවින් ඔවුන් විසින් ගෙවන ලද සමාසික ගාස්තු ආදායම වැඩි විණි. **පාඨමාලා ගාස්තු** - 2021 අධ්‍යයන වර්ෂය ඉවත් වීම මත එම වර්ෂයේ එක්වූ සිසුන් සමග 2022 වර්ෂයේ ලියාපදිංචි සිසුන් ප්‍රමාණය සැලකිය යුතුව වැඩි වූ බැවින් ඔවුන් විසින් ගෙවන ලද පාඨමාලා ගාස්තු ආදායම වැඩි විණි. **ප්‍රකාශණ අලවිය** - ඇස්තමේන්තුකල ආකාරයට බාහිර පාර්ශවයන් හා සිසුන් ආයතනය වෙත පැමිණීම අඩු වීම හා පෙර වර්ෂවල මෙන් ප්‍රකාශන මිලදි නොගැනීම තුළ ආදාල ආදායම අඩු වීමක් සිදු වී ඇත. **බාහිර ආයතනවලට සපයනලද සේවා** - මෙහි ප්‍රධාන ආදායමක් වන ආයතනයේ වාහන බාහිර ආයතනවලට හා පුද්ගලයන්නට සැපයීම හරහා ලද මුදල් ය. ආයතනයේ පර්යේෂණ ආධාර අරමුදල් යටතේ අධ්‍යයනය කටයුතු කරන සිසුන් විසින් ලබාගන්නා ලද සේවාවන් වෙනුවෙන් එකවර ගෙවීම් කිරීම හේතුවෙන් මෙම ආදායම වැඩි විණි. **වැඩමුළුවලින් හා සම්මන්ත්‍රණ**- 2022 වර්ෂය පුරාවට රටතුල පැවැති ආර්ථික වාතාවරණය මත වැඩමුලු සහ සම්මන්ත්‍රණ සංවිධානය අඩු වීම හා අත්හිටු වීම මත වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් ලැබෙන ආදායම් ප්‍රමාණය අඩුවිණි. **කොළඹ ශාඛාවේ ආදායම** - 2022 වර්ෂය සඳහා කොළඹ ශාඛාව වෙනුවෙන් සිසුන් ලියාපදිංචි වැඩි වූ බැවින් පෙර වර්ෂවල ලියාපදිංචි සිසුන්ගෙන් ලැබුණු ආදායම හා මෙම වර්ෂයේ ආදායම යන දෙකම ගෙන ඇත එබැවින් කොළඹ ශාඛාවේ ආදායම වැඩි විණි. **පාරිතෝෂික දීමනා** - පාරිතෝෂික දීමනා ඇස්තමේන්තුගත කරනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින්

		සැලකිල්ලට ගනිමින් හා පෙර වර්ෂයේ වියදම සැලකිල්ලට ගණිමිනි ඒ අනුව ඇස්තමේන්තු සකස් කළ නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව පවතින වට්ටම් අනුපාතිකයට අනුගතව කරන ගණනයේදී ලබාදුන් අගය අඩුවීම මත මෙම වියදම අඩුවිණි. **සංනිවේදන දිමනා** - ඇස්තමේන්තුකල පසු රජයේ ප්‍රතිපත්ති මත අදාල දිමනාව ගෙවන ප්‍රතිශත අඩු කිරීම නිසා වර්ෂය තුළ ආදාල වියදමේ අඩු වීමක් සිදු වී ඇත. **දේශිය ගමන් වියදම්** - ඇස්තමේන්තුකල ආකාරයට වර්ෂයේ ගමන් බිමන් සිදු නොවීම නිසා වර්ෂය තුළ අදාල වියදමේ අඩු වීමක් සිදු වී ඇත. **ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා** - 2022 වසරේදී ලිපිදව්‍ය මිල ඉහල යාම මත සියලුම අංශ භාවිතා කල ලිපිදව්‍ය උපයෝගී කර ගනිමින් පිටපත් සිදු කිරීම මඟින් මිලදිගැනිම් වියදම අඩු වීම හා පෙරවර්ෂවල වියදම් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු පිළියෙල කළද ප්‍රසම්පාදන සැලැස්ම අනුව වසරකට දෙවරක් වූ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම ලිපිදව්‍ය මිල ඉහල යාම මත එක් වරක් පමණක් මිලදී ගැනීමෙන් අදාල වියදම් ඉතිරි වීමක් සිදු වී ඇත. **නිලඇදුම් වියදම්** - 2021 වර්ෂයේ නිලඇදුම් වලට අදාලව බිල්පත් ආයතනය වෙත ඉදිරිපත් නොවීමත් 2022 වර්ෂයේ දී ඉදිරිපත් කල බිල්පත වර්ෂ දෙකටම අදාල වීමත් එය වෙන්කල නොහැකි වීමත් මත අදාල වර්ෂ දෙකටම අදාල වියදම 2022 වර්ෂයේ වියදමට ගෙන ඇත අදාල වියදමේ වැඩි වීමක් සිදු වී ඇත. **යන්ත්‍ර සූත්‍ර නඩත්තුව** - අප ආයතනයේ ඇති ඡායා පිටපත් යන්ත්‍ර පැරනි බැවින් නිතර අලුත්වැඩියා කිරීමට සිදුවීම හා මුද්‍රණ යන්ත්‍රය ඇතුළු අනෙකුත් යන්ත්‍ර කිහිපයකම අක්‍රිය වූ හා ගෙවීගිය කොටස් මාරුකිරීමට සිදුවීම හා වාර්ෂික සේවා ගිවිසුම් සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තු කල මුදලට වඩා වැඩි මුදලක් වැය වීමත් නිසා තථ්‍ය වියදම වැඩි වුණි.

		විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ චාරිකා ප්‍රදාන - මෙය කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉගැන්වීම සඳහා පැමිණෙන බාහිර කථිකාචාර්යවරුන්ගේ ගමන් වියදමයි. පෙර වර්ෂ කිහිපයේ මෙම වියදම ඉතා අඩු වීම මත ඇස්තමෙන්තුව අඩු කලද ගමන් වියදම් ඉල්ලීම් ප්‍රමාණය වැඩි වීම මත වියදම වැඩි වී ඇත. **අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන** - අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන සඳහා වන වියදම් වෙනුවෙන් කරන ලද ඉල්ලීම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීමෙන් වියදම අඩු වී ඇත. **සේවක සංවර්ධණය** - පෙර වර්ෂයන් හා සසඳා ඇස්තමේන්තු ගතකලද 2022 වර්ෂයේ දී අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදල හා සත්‍ය වියදම අතර අඩු වීමක් දක්නට ලැබිණි **නිවාඩු, දුම්රිය බලපත්‍ර** - පෙර වර්ෂයන් හා සසඳා ඇස්තමේන්තු ගතකලද 2022 වර්ෂයේ වාර ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදල හා සත්‍ය වියදම අතර වැඩිවීමක් දක්නට ලැබිණි. **ක්‍රීඩා ක්‍රියාකාරකම්** - සැලසුම් කල පරිදි අධ්‍යක්ෂ කුෂලාන ක්‍රිකට් තරගාවලිය හා අනිකුත් ක්‍රීඩා කටයුතු කිරීමට නොහැකි වීම මත ඇස්තමේන්තුගත මුදල හා සත්‍ය වියදම අතර අඩුවක් දක්නට ලැබිණි. **බැංකු ගාස්තු** - පෙර වර්ෂයන් හා සසඳා ඇස්තමේන්තු ගතකලද 2022 වර්ෂයේ කාඩ්පත් මගින් ගෙවීම් වැඩි වීම හා විදේශ ගණුදෙනු වැඩි වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදල හා සත්‍ය වියදම අතර වැඩිවීමක් දක්නට ලැබිණි. **විභාග ගාස්තු** - පෙර වර්ෂයන් හා සසඳා ඇස්තමේන්තු ගතකලද 2022 වර්ෂයේ විභාග කටයුතු වැඩි වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදල හා සත්‍ය වියදම අතර වැඩිවීමක් දක්නට ලැබිණි.

		අනෙකුත් පුනරාවර්තන වියදම් - ව්‍යවස්ථාපිත වියදම් ශීර්ෂයන්ට බාහිරව පැමිණිය හැකි වියදම් අවම වීමෙන් ඒ වෙනුවෙන් වෙන් කරන ලද මුදල අඩුවිණි. **උපාධි උත්සව වියදම් -** පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධි උත්සවයට අදාලව මුදල් ඉල්ලීමක් නොකල බැවින් වෙන් කරන ලද මුදල ඉතිරි විය. **අධ්‍යයන චාරිකා වියදම් -** පෙර වර්ෂයන් හා සසඳා ඇස්තමේන්තු ගතකලද 2022 වර්ෂයේ අධ්‍යයන චාරිකා යාම අවම වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදල හා සත්‍ය වියදම අතර අඩු වීමක් දක්නට ලැබිණි.

අධ්‍යක්ෂක

කෘෂිකර්මවිද්‍ය පශ්චාත් උපාධි ආයතනය

34th Annual Congress - 2022





Blood Donation Campaign - 2022



